# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2135/61 - 2019 අගෝස්තු මස 09 වැනි සිකුරාදා - 2019.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග

2008.06.10 වැනි දින අංක 1553/10 දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග නැවත සමාලෝචනයට හා සංශෝධනයට ලක්කර රජයේ අනුමැතිය ලබා ගන්නා ලද අතර පහත උපලේඛනයේ සඳහන් ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය රවි කරුණානායක වන මම මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරමි.

රවි කරුණානායක,
විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය.

2019 අගෝස්තු මස 08 වැනි දින.

**ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග**

***විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය - ශ්‍රී ලංකා රජය***

ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග (2008) ප්‍රකාශනයට අනුව රට තුළ පූර්න විදුලියන ආවරණයක් සහ පුනර්ජනනීය විදුලිබල සංවර්ධනයේ ඉලක්ක රැසක් මේ වන විට ජයගෙන ඇත. මෙම ලේඛනයෙන් ප්‍රකාශ කෙරෙන ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ගයන්හි මූලික අරමුණ වන්නේ, ශ්‍රී ලංකාව සමාජ සාධාරණ සංවර්ධනයකට නතු කිරීම සඳහා උපකාර කරනු පිණිස පහසු, දැරිය හැකි මිළකට බලශක්ති සේවාවන් සැපයීම සඳහා පිරිසිදු, ආරක්ෂාකාරී, තිරසර, විශ්වාසදායී ආර්ථික වශයෙන් ශක්‍ය බලශක්ති සැපයුමක් පවත්වා ගැනීම සහතික කිරීමයි. මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ඉදිරි ඉලක්ක, වර්තමාන ගෝලීය බලශක්ති ප්‍රවණතාවයන්, එක්සත් ජාතීන්ගේ සත්වන තිරසර සංවර්ධන අභිමතාර්ථය අනුව සකස් කර ඇත. මෙම බලශක්ති

ප්‍රතිපත්තිය සමාජ, ආර්ථික හා පාරිසරික බලපෑම් කළ හැකි, පෘථුල වපසරියක ව්‍යාප්තව ඇති අතර මෙමගින් වසර 2050දී අත්කර ගැනීමට නියමිත පූර්ව කාබන්හරණය මෙන්ම සියලු බලශක්ති සැපයුම් ජාලයන්ගේ පූර්න සංක්‍රාන්තිය වෙත ඇරඹෙන දිගු ගමනට මංපෙත් හෙළිකරනු ඇත.

නිශ්චිත බලශක්ති ඉලක්ත තුළින් අපේක්ෂිත ප්‍රතිපත්ති අභිප්‍රායන් වෙත ලඟාවීම සඳහා සහ ප්‍රතිපත්ති අභිප්‍රායන් සාක්ෂාත් කර ගැනීමේ වගකීම පැවරෙන ආයතනික වගකීම් ද සහිත කාර්ය සාධන කාල රාමුව මෙම ලේඛනයෙහි දක්වා තිබේ. ශ්‍රී ලංකාවේ මෙම ජාතික බලශක්ති සහ උපාය මාර්ග ප්‍රකාශයට පත් කිරීමට පෙර එහි කෙටුම්පත සඳහා මහජනතාවගේ අදහස් ලබාගෙන බලශක්ති ක්ෂේත්‍රය හා සම්බන්ධ විද්වත් කමිටුවක් විසින් නැවත සමාලෝචනය කොට අවශ්‍ය සංශෝධනයන් සිදු කොට තිබේ.

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කෙරෙන අතර එහි බලපෑම මා විසින් පත්කරන ලද ප්‍රධාන බලශක්ති අංශ නියෝජිතායතනවල සභාපතිවරුන්, සාමාන්‍යාධිකාරීවරුන් සහ අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගෙන් සමන්විත සහ ප්‍රවාහන, පරිසරය වැනි අනුබද්ධ අංශවල නියෝජිතයන්ද ඇතුළත් ජාතික මෙහෙයුම් කමිටුවක් මගින් ඇගයීමට ලක් කරනු ලැබේ. කමිටුව කාර්තුමය පරාසයන් තුළ රැස්වීම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අමාත්‍ය මණ්ඩලයට වාර්තා කිරීම අවශ්‍ය වන අතර අදළ ඕනෑම අංශයක් නියෝජනය කිරීම සඳහා අවශ්‍ය යැයි සිතන ඕනෑම නව සාමාජිකයින්ද බඳවා ගැනීමට බලය ඇත. මෙම කමිටුවේ මුලසුන දරනු ලබන්නේ විදුලිය හා බලශක්ති යන විෂයන් සඳහා වගකිව යුතු අමාත්‍යාංශයේ ලේකම් විසිනි.

කාර්යාසාධන කාල රාමුව තුළ හඳුනාගෙන ඇති පරිදි වගකිවයුතු ආයතන සමග රැස්වීම් කැඳවීම, ක්‍රියාකාරී සැලසුම් සංශෝධනය, ප්‍රගති තොරතුරු සහ වෙනත් ලිපි හුවමාරු කරගැනීම සඳහා තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායමක් විසින් ජාතික මෙහෙයුම් කමිටුවට සහාය වනු ඇත. ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග සැකසීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරන ලද කමිටුව තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම ලෙස කටයුතු කරනු ඇත.

මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් විවිධ අවස්ථාවන්හිදී ප්‍රකාශයට පත් කරනු ලැබූ සියලු ප්‍රතිපත්ති, උපාය මාර්ග, සැලසුම් සහ මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කෙරේ. බාහිර පරිසරයේ සිදුවිය හැකි සැලකිය යුතු වෙනස්වීම්වලට අනුගත වීම පිණිස සමාලෝචනයන් සිදුකරන තෙක් මෙම ලේඛනය බලපැවැත්වෙනු ඇත. මෙම ප්‍රකාශනය අවම වශයෙන් සය වසරකට වරක් හෝ එවැනි සමාලෝචනයකට ලක් කළ යුතුය. මෙයට සම්බන්ධිත කාර්යසාධන කාලරාමුව සෑම වසර දෙකකට වරක්ම සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

**ශ්‍රී ලංකා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග**

2019 අගෝස්තු

**පූර්විකාව**

පසුගිය දශක කිහිපය තුළ බලශක්ති ක්ෂේත්‍රය ලැබූ ජයග්‍රහණයන් රැසකි.
එමෙන්ම එලඹෙන දශක කිහිපයේ මුහුණ දීමට තිබෙන අභියෝගයන්ද රැසකි.
අප ජාතිය පූර්ණ විදුලියනය සහ තවත් එවැනිම ප්‍රතිපත්තිමය ඉලක්ක රැසක් ජයගෙන ඇත්තේ
ශ්‍රී ලංකා බලශක්ති ප්‍රතිපත්ති හා ක්‍රමෝපාය (2008) ප්‍රකාශනයට අනුකූලවයි.
බලශක්ති සුරක්ෂිතතාව ක්ෂය වෙමින් පවතින ලෝකයක ජාතික ආර්ථිකයේ
ඔරොත්තු දීමේ හැකියාවට මහත් රුකුලක් වූ පුනර්ජනනීය බලශක්තියේ
විශාල දායකත්වය රැක ගැනීමේ තිර අදිටනින් ශ්‍රී ලංකාව ඉදිරියෙන්ම සිටියි.
මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය රටේ බලශක්ති ක්ෂේත්‍රයේ ඉදිරි ගමනට මං සලකුණු පෙන්වා දී
ස්ථාවර ආර්ථිකයකට එම ක්ෂේත්‍රයේ දායකත්වය ලබා දෙනු ඇත.

දශකකීපයක් පුරා ඇදී ගිය යුද ගිනි දැල් නිවා
මුළු රටටම අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කොට ඇති අතර
රට පුරා විසිරී ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මෙලෙස සැපයූ විදුලිය යොදා ගෙන
වඩා ඵලදායී ලෙස අමුද්‍රව්‍ය හා මානව සම්පත් පරිහරණයට සූදානම්ව සිටියි.
රටේ සියළු පුරවැසියන්ගේ නවීන බලශක්ති සම්පාදනයේ සිහිනය සැබෑ කරමින්
වායු, ද්‍රව හා ඛනිජ වැනි ඉන්ධන මගින් නිෂ්පාදිත විදුලිය ද රට පුරා බෙදා හැරේ.

සේවා අංශයේ 60% ක ශක්තිමත් දායකත්වයෙන් පරිණාමනය වන ජාතික ආර්ථිකයේ නව ව්‍යුහය
ඉගිකරනුයේ රට තව දුරටත් බලශක්ති පිරිමැසුම් මාවතේ සිය
ආර්ථික වර්ධන අභිලාෂය වෙත ගමන් කරනු ඇති බවයි.
තවද දැනුමින් කුළුගැන්වුණු ආර්ථිකයක් කරා තැබෙන යෝධ පියවර
ආර්ථිකයේ බලශක්ති තීව්‍රතාව වර්තමානයේ පවතින හිතකර මට්ටමේම
පවත්වා ගැනීමට මහත් පිටිවහලක් වනු ඇත.
නිරන්තරයෙන් බලශක්ති අර්බුදවලින් බැට කන ලෝකයක සවිමත් ආර්ථිකයක් සාක්ෂාත් කර ගැනීමට
මෙම ප්‍රතිපත්තිය මඟ සලසනු ඇත.

මෙම ප්‍රතිපත්තිය විසින් මේ වන විට දැරිය නොහැකි සහනාධාර බරින් මිරිකී හුදු පැවැත්ම සඳහා
අරගලයක නිරත බලශක්ති කර්මාන්තය නවෝත්පාදනයෙන් ආර්ථිකය පුබුදුවන
උත්ප්‍රේරකයක් බවට පරිවර්තනය කරන අතරම
රට ගෝලීය බලශක්ති සංක්‍රාන්තියටද සූදානම් කරනු ඇත.
රටවැසියන් අත්කර ගන්නා නව ආර්ථික නිදහස උසස් ප්‍රමිතියෙන් සම්පාදනය වන
බලශක්ති සේවා වෙනුවෙන් ගෙවිය යුතු මිල පැකිළීමකින් තොරව ගෙවීමට
අවකාශය සපයනු ඇත.
සියලු ශ්‍රී ලාංකිකයන්ගේ දිගුකාලීන යහපත උදෙසා කාර්යක්ෂමව සහ සඵලදායීව
බලශක්ති ක්ෂේත්‍රය මෙහෙයවීම සඳහා එහි නියැළී සිටින වෘත්තිකයන්ගේ
හැකියාවන් වර්ධනය කිරීමටද මෙම ප්‍රතිපත්තිය හේතු වනු ඇත.

පුනර්ජනනීය බලශක්තියේ ජාතික දායකත්වය රැකගැනීමට එහි නැගී එන භූමිකාවට අවස්ථාව සලසා
නව තාක්ෂණයෙන් සඵල වූ එවැනි පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර
වැඩි වැඩියෙන් බලශක්ති ප්‍රවාහයට එකතු කර ගැනීමට
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදාගැනීමට මෙම ප්‍රකාශනය ඉඩ සපයා ඇත.
බලශක්ති ඉල්ලුම් වර්ධනය ප්‍රශස්ත මට්ටමක පවත්වාගෙන යාමට
සමස්ත සැපයුම් දාමයේ බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධනයද
මෙමගින් සාක්ෂාත් කරගනු ඇත.දේශගුණික විපර්යාස නිසා
එල්ලවී ඇති අභියෝග ජයගැනීමට ශ්‍රී ලංකාවේ කැපවීම සහතික කරමින් බලශක්ති ක්ෂේත්‍රයේ
සියළු පාර්ශ්වකරුවන්ගේ උත්සාහයන් කැටි කොට දේශගුණික විපර්යාසයට
කේන්ද්‍රීය,අර්ථාන්විත සහ ශක්‍ය වූ ප්‍රතිචාරයක් දැක්වීමටද
මෙම ප්‍රතිපත්තිය දායක වනු ඇත.

## 1. හැඳින්වීම

බලශක්ති සම්පාදන විකල්ප සංඛ්‍යාවේ වර්ධනය, නව බලශක්ති වාහක හා වැඩිවන විදුලි ඉල්ලුම ආදී කරුණු නිසා වර්ධනය වන සංකීර්ණත්වයට මුහුණ දෙමින් ලෝක බලශක්ති ක්ෂේත්‍රය තීරණාත්මක සංක්‍රාන්තියකට එළඹ තිබේ. ශ්‍රී ලංකාවද මෙම සංක්‍රාන්තියට ඉදිරි දශක කිහිපයේදී මුහුණ දෙනු ඇත. මෙම පරිවර්තනය වෙමින් පවතින බලශක්ති ක්ෂේත්‍රය රටේ ආර්ථික වර්ධනය බලගන්වනුයේ එහි නිම්වලලුපුළුල් කරමින් මෙන්ම නවමු අවස්ථාවන්ද ජනිත කරමින්ය. මෙම ජාතික බලශක්ති ප්‍රතිපත්තිය මඟින්,ගැටළුවකින් තොරව බලශක්තිය සපයා ගත හැකි අනාගත සශ්‍රීකත්වයක් සඳහා සියලු රාජ්‍ය සහ පෞද්ගලික ව්‍යවසායන්, නිවාස සහ කර්මාන්ත සඳහා මනා අවකාශයක් සැපයීමට මෙන්ම අවම පාරිසරික භාරයක් සමඟින් ඉහළ ඵලදායිතාවයක්, ආරක්ෂාවක් සහ බාහිර බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාවක් සහිතව තිරසාරත්වයක් අත්කරගනිමින් ජාතිය සහ එහි සමාජ වෙළඳපොළ ආර්ථිකය බලගැන්වීම සඳහා, සංක්‍රාන්තියට මුහුණ දෙන බලශක්ති ක්ෂේත්‍රයේ ඉදිරි ගමනට මංසලකුණු සපයනු ඇත.

ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානව සංවර්ධන දර්ශකයෙහි මධ්‍යස්ථ පරාසයක ශ්‍රේණිගත කර ඇති අතර වාර්ෂික ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය ඇ.ඩො. 4,065 (2017)[1] ක මධ්‍යස්ථ පරාසයක පවතී. මෙම දශකය තුළදී ඉහළ මධ්‍යම ආදායම් මට්ටම කරා ළඟා වීමේ රජයේ ප්‍රයත්නය, ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ බලශක්තියෙහි කාර්යභාරය තීව්‍ර කරනු ඇත. දශක තුනක දීර්ඝ ගැටුමකින් පසු ප්‍රගතිශීලී සමාජ වෙළඳපොළ ආර්ථිකයක් කරා යන ජාතියක් ලෙස, වර්ධනාත්මක ප්‍රවේශයක් හා සැසඳීමේදී සංවර්ධනය සඳහා සාකල්‍ය ප්‍රවේශය වඩා සුදුසු වේ. ඒ සඳහා සමාජ සහ ආර්ථික සංවර්ධන අභිමතාර්ථ සමඟ අනුරූප වන බලශක්ති ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ.

රුපියල් දශලක්ෂයක දළ දේශීය නිෂ්පාදනයක් කිරීම සඳහා ටෙරා ජූල් 0.47ක වාණිජ බලශක්තියක් භාවිතා කරමින් ශ්‍රී ලංකාව සාපේක්ෂ වශයෙන් අඩු බලශක්ති තීව්‍රතාවයක් පවත්වාගෙන යයි[2]. ආර්ථික වර්ධන වේගය වැඩි කරමින් අඩු

[1] ලෝක බැංකුව http://data,worldbank.org/country/sri lanka

[2] ශ්‍රී ලංකා බලශක්ති කුලනය 2016, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

බලශක්ති තීව්‍රතාවයක් පවත්වා ගැනීම ශ්‍රී ලංකාව මුහුණ දී ඇති අභියෝගයක් වේ. ශ්‍රී ලංකාව නුදුරේදීම 100%ක විදුලියනය කරා ලඟා වනු ඇති අතර එමගින් සියලු පුරවැසියන්ට ඉහළ මට්ටමේ බලශක්තීන් ලබාදීමේ අභිමතාර්ථය සාක්ෂාත් කරගනු ඇත.

ආර්ථික වර්ධනය උදෙසා මෙන්ම, සියලුම ජනතාවට ජාලගත බලශක්තිය ලබාදීම සඳහා බලශක්ති සැපයීමේ ධාරිතාවයන් නිරන්තරයෙන් ඉහළ නැංවීම අවශ්‍ය වේ. ඉල්ලුමෙහි වර්ධනය, බලශක්ති පරිවර්තන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමෙන්ද පාලනය කළ හැකි වේ. අඩු බලශක්ති තීව්‍රතාවයක් පවත්වා ගැනීම සඳහා දරනු ලබන අඛණ්ඩ උත්සාහයන් ආර්ථිකය සහ පරිසරය මත අඩු භාරයක් ඇති කරනු ඇත. ඉහළ ආර්ථික වර්ධනයක් අත්පත් කර ගන්නා අතරම මෙම අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති මත දිවෙන අනුබලයන් හරහා ඉල්ලුම්-පාර්ශව කළමනාකරණය මත වැඩි ප්‍රයත්නයක් දැරීම අවශ්‍ය වේ.

වාණිජ බලශක්තිය වැඩියෙන්ම භාවිතා කරන අංශය වන ප්‍රවාහනක්ෂේත්‍රයෙහි ඵලදායීව බලශක්තිය කළමනාකරණය සිදු කිරීම සඳහා ප්‍රවාහන යටිතල පහසුකම් සංවර්ධනය සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම තුළින් ඛනිජ තෙල් නිෂ්පාදන හැර වෙනත් ආකාරයේ බලශක්ති භාවිතා කිරීම උනන්දු කරවීම මෙන්ම වඩාත් කාර්යක්ෂම පද්ධති කරා ප්‍රවාහන ක්‍රමවේද පරිවර්තනය කිරීම අවශ්‍ය වේ.

ගෘහස්ත බලශක්ති භාවිතය ඛනිජ ඉන්ධන කරා යොමුවීමත්,එමෙන්ම දැනටමත් ජල විදුලි විභවය මුළුමනින්ම පාහේ සංවර්ධනය කොට ඇති නිසාත් සියලු ආකාරයේ බලශක්ති සඳහා වර්ධනය වන ඉල්ලුම ඛනිජ ඉන්ධන මඟින් සපුරා ගැනීම නිසා දිවයිනෙහි මූලික බලශක්ති එකතුවෙහි සාපේක්ෂ වශයෙන් ඉහළ වූ පුනර්ජනනීය බලශක්ති භූමිකාව ක්‍රමයෙන් ක්ෂය වී ඇත. ජල සම්පත් විවිධ අවශ්‍යතාවයන් සපුරාලන අතර,පානීය ජලය සහ කෘෂිකාර්මික ඉල්ලුමට වඩා අඩු ප්‍රමුඛතාවයක් ජල විදුලියට හිමිවේ. එම තත්ත්වය යටතේ මහවැලි දෙවන අදියර සංවර්ධනයවැනි ව්‍යාපෘති හා සම්බන්ධ ගැටලු තවදුරටත් සංකීර්ණත්වයට පත් වී ඇත.මූලික බලශක්ති සැපයුමෙහි පසුගිය දශකයේදී පවත්වා ගත් 55%ක මට්ටමේ පුනර්ජනනීය බලශක්ති දායකත්වය ආරක්ෂා කර ගැනීමටත් තවදුරටත් වර්ධනය කිරීම සඳහාත් ප්‍රතිපත්තියෙහි සුසමාදර්ශී වෙනසක් අපේක්ෂා කෙරේ.

සමාජ වෙළඳපොළ ආර්ථිකයට අවශ්‍ය බලශක්තිය සැපයීම සඳහා විවිධ බලශක්ති මූලාශ්‍රයන්ගෙන් විශ්වාසදායී, පිරිවැය-ඵලදායී සහ තරඟකාරී ලෙස මිල නියම කරන ලද බලශක්ති සේවාවන් ලබාදීම සහතික කිරීම සඳහා බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය සහ කළමනාකරණය කිරීමේ අභියෝගයට මුහුණ දීමට ශ්‍රී ලංකාව සැලසුම් කරන්නේ කවර ආකාරයෙන් ද යන්න මෙම ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග මගින් ඉදිරිපත් කරනු ලැබේ.

විවිධ ගැඹුරු මූලයන්ගෙන් ලැබුණු ඔරොත්තු දීමේ හැකියාව හේතුවෙන් පසුගිය දශක කිහිපයේදී ශ්‍රී ලංකාව බලශක්ති අර්බුදයන්ට සාර්ථකව මුහුණ දී ඇත. ඉහළ ජෛවස්කන්ධ සම්පත් භාවිතය, වර්ෂය පුරා ලැබෙන සූර්යාලෝකය සහ අධික වර්ෂාපතනය සමඟ සම්බන්ධ වූ ජනතාවගේ සරල ජීවන රටාව සහ දිවයිනෙහි කුඩා භූ ගෝලීය වපසරිය මෙම මූලයන් ලෙස හඳුනාගත හැකිය.

මෙම ගැඹුරු මූලයන්ගෙන් ජාතික ආර්ථිකයපෝෂණය කර, අඛණ්ඩ සැපයුමක් සමඟින් මුළු දිවයිනටම සේවා සැපයීම සඳහා ජාතික විදුලිබල සැපයුම ව්‍යාප්ත කිරීම හරහා ඒ සම්බන්ධ කලාපයෙහි පුරෝගාමීයා වීමට ශ්‍රී ලංකාව සමත් වී ඇත. අවම බලශක්ති යෙදවුමක් සමඟින් දිවයිනට වඩාත් වැඩි ආර්ථික ප්‍රතිලාභ අත්පත් කර දෙමින් බලශක්ති පද්ධතිවල විශ්වාසදායිත්වය හරහා සේවා අංශය දිවයිනට ආකර්ෂණය කරගෙන ඇත. ආර්ථිකයෙහි බලශක්ති තීව්‍රතාවය අධික වර්ධනයක් සහිත සංවර්ධනය වන වෙනත් ආර්ථිකයන්ට වෙනස් වෙමින් ආර්ථිකයෙහි ව්‍යුහාත්මක වෙනස්වීමක් සිදුකර ඇත.

දේශීය සහ ගෝලීය බලශක්ති සැපයුම්වල විශ්වසනීයත්වය සහ දැරිය හැකි මිලකට බලශක්තිය ලබා ගැනීමේ හැකියාව, පරිවර්තනය වෙමින් පවතින මෙම ආර්ථිකයෙහි වඩාත් වැදගත් පැතිකඩ වනු ඇත. විදුලි ජනනය සඳහා සුළං සහ සූර්ය බලය වැනි මෑත කාලය තුළවැඩි දියුණු වූ ඉහළතරඟකාරීත්වයක් සහිත සම්පත් සංවර්ධනය කිරීම වඩාත් අවධාරණය කරනු ලබන අනාගතයක් සඳහා අපි පෙර මඟ බලා සිටිමු. වඩාත් වැදගත් බලශක්ති සම්පතක් වන ජෛව ස්කන්ධ, ගෘහස්ත භාවිතය සඳහා පහසු ඉන්ධනයක් ලෙස පරිවර්තනය වීම සිදු කිරීමෙන් සහ කර්මාන්ත තාප බලශක්ති සැපයුම සඳහා විශ්වාසය තැබිය හැකි සම්පතක් ලෙස වර්ධනය කිරීමෙන් වඩාත් වැඩි වටිනාකමක් සහිත කාර්යභාරයක් ඉටු කරනු ඇත.

විශාල වශයෙන් දේශීය සම්පත් භාවිතා කිරීම සඳහා උපාය මාර්ග සහ පරිවර්තන තාක්ෂණ සකස් කිරීමෙන් ශ්‍රී ලංකාව,'බලශක්තියෙන් බලගැන්වුණු ජාතියක්'ලෙස නැගී සිටීමට අපේක්ෂා කෙරේ. බලශක්ති මූලාශ්‍ර අන්තයේ සම්පත් සංවර්ධනයෙහි සිට පරිභෝජන අන්තයේ විවිධාංගිකරණයක් කරා ඛනිජ තෙල් අංශය ශක්තිමත් කිරීම සඳහා අඛණ්ඩ ප්‍රයත්නයන් දරනු ලබන අතරම, ප්‍රධාන බලශක්ති වාහකයා ලෙස විදුලි බලයෙහි තත්ත්වය ඉහළ නැංවීම සඳහා මුලපිරීම්

සිදු කරනු ඇත. ප්‍රවාහන අංශයෙහි ද්‍රවඛනිජ ඉන්ධන ආධිපත්‍යයෙහි සිට වෙනත් බලශක්ති මූලාශ්‍රයන් කරා පරිවර්තනය වෙමින් දේශීය සම්පත් වඩාත් ඉහළ මට්ටමින් උකහා ගනිමින් නව බලශක්ති වාහක ගවේෂණයෙහි විදුලිය ප්‍රධාන ස්ථානයක් හිමිකර ගනු ඇත. ස්වභාවික වායු පර්යන්ත, උත්පාදන ප්‍රදේශ සහ සම්ප්‍රේෂණ මාර්ග වැනි වැදගත් බලශක්ති යටිතල ව්‍යූහ සඳහා ඉඩම් සම්පත් ආරක්‍ෂා කර ගනිමින්, පාරම්පරික බලශක්ති පද්ධති අවහිර කළ කාල අවකාශ සීමා ඉක්මවා යෑම සඳහා බලශක්ති ගබඩා කිරීම ප්‍රධාන වාහකය ලෙස පිළිගැනෙනු ඇත.

එක්සත් ජාතීන්ගේ සත්වන තිරසර සංවර්ධන අභිමතාර්ථය සමඟ පෙළ ගැසෙමින් ශ්‍රී ලංකාව, වර්ෂ 2020 වන විට, එනම් අපේක්ෂිත වර්ෂයකට දශකයක් කලින් සියලුම ජනතාවට බලශක්තිය ලබාදීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ප්‍රතිපත්තිය දායක වනු ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික බලශක්ති සැපයුම තුළඛනිජ ඉන්ධන දායකත්වය 50%කට අඩු කිරීම සඳහා මෙන්ම වර්ෂ 2030 වන විට සියළු බලශක්ති යෙදවුම්වල විශිෂ්ට බලශක්ති භාවිතය 2015 පැවති මට්ටමින් 20% කින් අඩු කිරීමටද මෙම ප්‍රතිපත්තියෙන් දායකත්වය දක්වනු ඇත. මෙම ප්‍රතිපත්තිය විසින් වසර 2050 දී අත්කර ගැනීමට නියමිත රටේ අංගාර තුලනය මෙන්ම සියළු බලශක්ති සැපයුම් ජාලයන්ගේ පූර්ණ සංක්‍රාන්තිය වෙත ඇරඹෙන දිගු ගමනට ද මංපෙත් හෙළි කරනු ඇත.

මෙම ප්‍රතිපත්තිය විසින් පුනර්ජනනීය බලශක්ති තාක්‍ෂණ දේශීය වෙළඳපොළට සපයමින් ප්‍රධාන නිෂ්පාදන කර්මාන්ත පිහිටුවීම සඳහා අවශ්‍ය අවකාශය සපයනු ඇති අතර එක්සත් ජාතීන්ගේ සත්වන සංවර්ධන අභිමතාර්ථය අනුව යමින් දැනුම සහ පුනර්ජනනීය බලශක්ති තාක්‍ෂණ සම්පාදනය කිරීමෙන් දකුණු-දකුණු සහයෝගීතාව තුළින් වෙනත් සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ නව සංධාන ගොඩනගනු ඇත.

මෙම ප්‍රතිපත්ති ලේඛනය කොටස් තුනකින් සමන්විතය. ඒ මූලයන් දහයකින් යුතු ප්‍රතිපත්ති රාමුව ප්‍රකාශ කරමින් ජාතික බලශක්ති ප්‍රතිපත්තිය ලෙස ද,ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ක්‍රමෝපායන් විදහා දක්වමින් ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග ලෙස ද,නිශ්චිත ක්‍රියාමාර්ග, ඉලක්ක සපුරාගන්නා කාලසටහන් මෙන්ම වගකිව යුතු ආයතන ද විස්තර කරමින් කාර්යසාධන කාලරාමුව ද වශයෙනි.

*මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් විවිධ අවස්ථාවන්හි දී ප්‍රකාශයට පත්කරනු ලැබූ සියලුප්‍රතිපත්ති, උපායමාර්ග, සැලසුම් සහ මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කෙරේ. බාහිර පරිසරයේ සිදුවිය හැකි සැලකිය යුතු වෙනස්වීම්වලට අනුගතවීම පිණිස සමාලෝචනයන් සිදුකරන තෙක් මෙම ලේඛනය බලපැවැත්වෙනු ඇත. මෙම ප්‍රකාශනය අවම වශයෙන් සය වසරකට වරක් හෝ එවැනි සමාලෝචනයකට භාජනය වනු ඇත. මෙයට සම්බන්ධිත කාර්යා සාධන කාලරාමුව සෑම වසර දෙකකට වරක්ම සංශෝධනය කෙරෙනු ඇත.*


## 2. ජාතික බලශක්ති ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ සමානාත්මතා සමාජ සංවර්ධනයට උරදෙනු වස්, භාවිතයට පහසු ආකාරයේ බලශක්ති සේවාවන් පහසුමිළකට සැපයීම සඳහා, පිවිතුරු, සුරක්ෂිත, විශ්වසනීය මෙන්ම ආර්ථික ශක්‍යතාවය සහිත බලශක්ති සැපයුමක් පවත්වා ගැනීම සහතික කිරීම බලශක්ති ප්‍රතිපත්තියෙහි මූලික අරමුණ වේ. 2009 අංක 20 දරණ පනත යටතේ අවශ්‍යතාවයක් වන 'විදුලි කර්මාන්තය පිළිබඳ පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ' වැනි එක් එක් ක්ෂේත්‍රය සඳහා ව්‍යාවස්ථාපිතව නිකුත් කළ යුතු ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ මෙම ප්‍රතිපත්තිය පදනම්ව සම්පාදනය කොට නිකුත් කිරීමට අපේක්‍ෂා කෙරේ. මූලයන් දහයක් මත පදනම් වී ඇති මෙම ප්‍රතිපත්තිය සමාජ, ආර්ථික හා පාරිසරික බලපෑම් කළ හැකි පෘථුල වපසරියක ව්‍යාප්තව ඇත.

බලශක්ති ත්‍රෛකෝටිකය ලෙස හඳුනාගත හැකි සුරක්ෂිතතාවයේ සමානාත්මතාවයේ සහ සුනිත්‍යභාවයේ මෘදු සංකලනයෙන් ශ්‍රී ලංකාව ක්‍රමයෙන් ඉවත් වෙමින් සිටින බව දක්නට ලැබේ. මූලයන් දහයක් මත පදනම් වී ඇති මෙම ප්‍රතිපත්තිය සමාජ, ආර්ථික හා පාරිසරික බලපෑම් කළ හැකි පෘථුල වපසරියක ව්‍යාප්තව ඇත්තේ එම බලවේග පාලනය කොට සාමානාත්මතාව, සුරක්ෂිතතාව සහ සුනිත්‍යභාවය හරහා එකී ත්‍රෛකෝටික බලරාමුව තුලනය කරගැනුමටය.

1. බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම
2. බලශක්ති සේවා සම්පාදනය
3. ජාතික ආර්ථිකයට ප්‍රශස්ත පිරිවැයකට බලශක්ති සේවාවන් සැපයීම
4. බලශක්ති කාර්යක්‍ෂමතාවය සහ සංරක්‍ෂණය වැඩි දියුණු කිරීම
5. බලශක්ති ස්වාධීනත්වය ඉහළ නැංවීම
6. පරිසරය සුරැකීම
7. පුනර්ජනනීය බලශක්තියෙහි දායකත්වය ඉහළ නැංවීම
8. බලශක්ති ක්ෂේත්‍රයේ යහපාලනය ශක්තිමත් කිරීම
9. අනාගත බලශක්ති යටිතල ව්‍යූහ සඳහා ඉඩම් සුරක්ෂිත කිරීම
10. නව්‍යකරණය සහ ව්‍යවසායකත්වය සඳහා අවස්ථාවන් සැපයීම

මෙම සංකල්පය රූපසටහනක් මාර්ගයෙන් පහත දක්වා ඇත.




මෙම මූලයන් දහය විස්තරාත්මකව පහත දැක්වේ.

1. **බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම**
   අඛණ්ඩත්වය, ප්‍රමාණවත්භාවය සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා දිවයිනෙහි ප්‍රාථමික සහ ද්විතීයික බලශක්ති සැපයුම් සුරක්ෂිත කරනු ඇත.

2. **බලශක්ති සේවාසම්පාදනය**
   සියළු පුරවැසියන්ගේ ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා සහ ලාභ ලබන ආර්ථික කටයුතුවල නිරත වීම සඳහා විශ්වසනීය, භාවිතයට පහසු, ගුණාත්මක බලශක්ති සේවාවන් සමානාත්මතාවයෙන් යුතුව පහසු මිලට ලබාගත හැකි වන සේ සම්පාදනය කෙරෙනු ඇත.

3. **ජාතික ආර්ථිකයට ප්‍රශස්ත පිරිවැයකට බලශක්ති සේවාවන් සැපයීම**
   ජාතික ආර්ථිකය මත භාරය අඩු කිරීම සඳහා සහ අන්තර්ජාතික වෙළඳපොළ තුළදී දේශීයව නිෂ්පාදිත භාණ්ඩවල තරගකාරීත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා,දිගුකාලීනව පවතින ප්‍රශස්ත පිරිවැයකට බලශක්ති සේවාවන් ලබාදෙනු ඇත.

4. **බලශක්ති කාර්යක්ෂමතාවය සහ සංරක්ෂණය වැඩි දියුණු කිරීම**
   සැපයුම්කරුවන් මෙන්ම භාවිතා කරන්නන් ද සහභාගි කරගනිමින්, බලශක්ති දාමයන් තුළ සියලු අංශ ආවරණය වන පරිදි බලශක්තිය කාර්යක්ෂමව භාවිතා කිරීම ප්‍රවර්ධනය කරනු ඇත.

5. **බලශක්ති ස්වාධීනත්වය ඉහළ නැංවීම**
   බාහිර තත්ත්වයන් නිසා බලශක්ති සැපයීමට සිදුවන අනර්ථයන් අවම කිරීම සඳහා ආනයනය කරන සම්පත් මත රඳා පැවතීම අඩු කිරීමේ අරමුණින්, තාක්‍ෂණ, ආර්ථික, පාරිසරික සහ සමාජ අවහිරතාවයන් විසඳීමට යටත්ව,දේශීය බලශක්ති සම්පත් ප්‍රශස්ත මට්ටම් දක්වා සංවර්ධනය කරනු ඇත.

6. **පරිසරය සුරැකීම**
   ශ්‍රී ලාංකික බලශක්ති ක්ෂේත්‍රය තුළ අඩු මට්ටමේ අංගාර තීව්‍රතාවය තවදුරටත් අඩු කිරීමෙන් කාලගුණික විපර්යාස සංසිද්ධිය වෙත අර්ථාන්විත ප්‍රතිචාරයක් දක්වනු ඇත. ගෝලීය සහ දේශීය පරිසරය රැකගනු වස් බලශක්ති සේවාවන්හි අහිතකර පාරිසරික සහ සමාජීය බලපෑම් අවම කරනු ඇත.

7. **පුනර්ජනනීය බලශක්තියෙහි දායකත්වය ඉහළ නැංවීම**
   බලශක්ති තිරසාරත්වය ළඟා කරගැනීම සහ බලශක්ති අංශයෙහි ඉහළ ප්‍රත්‍යස්ථතා මට්ටමක් සාක්ෂාත් කර ගැනීම සඳහා දේශීය පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රශස්ත මට්ටමකට සංවර්ධනය කරනු ඇත.

8. **බලශක්ති ක්ෂේත්‍රයේයහපාලනය ශක්තිමත් කිරීම**
ආයෝජක සහ පාරිභෝගික විශ්වාසය තහවුරු කරගැනීම පිණිස වගවීම, සාධාරණත්වය සහ විනිවිදභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා බලශක්ති ක්ෂේත්‍රය තුළයහපාලනය ශක්තිමත් කළ යුතු වේ. බලශක්ති ක්ෂේත්‍රයේ යහපාලනය සහතික කිරීම සඳහා ස්ථාවර ප්‍රතිපත්ති වාතාවරණයක් සහතික කරනු ඇති අතර නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

9. **අනාගත බලශක්ති යටිතල ව්‍යුහ සඳහා ඉඩම් සුරක්ෂිත කිරීම**
සමාජීය බලපෑම් අවම කිරීම පිණිස බලශක්ති පර්යන්ත සහ ඒ ආශ්‍රිත සම්ප්‍රේෂණ මාර්ග පිහිටුවීම සඳහා උපාය මාර්ගික ස්ථාන කඩිනමින් හඳුනාගෙන ඒවා අත්පත් කරගෙන නිසිකලට සංවර්ධනය සඳහා සුරක්ෂිත කෙරෙනු ඇත.

10. **නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය සඳහා අවස්ථාවන් සැපයීම**
ශ්‍රී ලංකාව තුළ ඇති කුඩා වෙළඳපොළ නිසා තාක්ෂණ තීව්‍ර දේශීය ව්‍යාපාර ගොඩනැංවීමට අසීරු වේ. එම තත්ත්වය යටතේ සාපේක්ෂ වශයෙන් ඉහළ විශාලත්වයක් සහිත බලශක්ති ක්ෂේත්‍රය, දේශීය නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය වර්ධනය වීමට ඉඩ සලසන සරු පසක් කෙරෙනු ඇත.

3. **ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග**
ඉහත සඳහන් කරන ලද මූලයන් දහය සමඟ පෙළ ගැසෙන ජාතික බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා වන පුළුල් උපායමාර්ග පහත විස්තර කර ඇත.

3.1 **බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම**
උපායමාර්ග ක්‍රියාවට නැංවීමෙන් දිවයිනෙහි බලශක්ති සැපයුමෙහි විශ්වසනීයත්වය සහ උපායමාර්ගික ස්වාධීනත්වය ඉහළ නැංවීම සඳහා දිවයිනෙහි භාවිතා කරනු ලබන ප්‍රාථමික සහ ද්විතීයික බලශක්ති සම්පත් සහ සැපයුම් සුරක්ෂිත කරනු ඇත.

3.1.1 ආර්ථික, පාරිසරික, තාක්ෂණික සහ මෙහෙයුම් අවශ්‍යතාවන්ට යටත්ව,විදුලිබල ජනනය සඳහා යොදා ගැනෙන බලශක්ති මූලාශ්‍රයන්හි විවිධාංගීකරණය සහතික කෙරෙනු ඇත.

3.1.2 පවත්නා ඛනිජ ඉන්ධන විකල්ප අතුරින් මෑත අතීතයේ මිල ප්‍රවණතා සලකා බලා ස්වාභාවික වායු ඉන්ධනය ඊළඟ ඛනිජ ඉන්ධන විකල්පය ලෙස තෝරාගැනේ. ප්‍රශස්ත ධාරිතාවකින් සහ තාක්ෂණයකින් යුතු ද්‍රව ස්වාභාවික වායු පර්යන්තයක් ඊට සුදුසුම ස්ථානයක ස්ථාපනය කරනු ඇත. රටේ බලශක්ති සුරක්ෂිතතාව පිණිස එම පර්යන්තයේ ක්‍රියාකාරීත්වය මෙන්ම ස්වාභාවික වායු මිලදී ගැනීමේ වගකීමද රජය සතුවනු ඇත.

3.1.3 බාහිර භූ-දේශපාලනික අවිනිශ්චිතතාවයන්ට එරෙහිව සැපයුම් දාමය ආරක්ෂා කිරීම සඳහා බලශක්ති සම්පත්වල ගෝලීය විවිධාංගිකරණය සිදු කරගෙන යනු ඇත.

3.1.4 සමස්ත විදුලි සැපයුම මත අනිසි බලපෑම ඇති කළ හැකි භූ දේශපාලනික අවිනිශ්චිතතා මෙන්ම මිල විචල්‍යතා පාලනය සඳහා, කිසිදු ආනයනික ඉන්ධනයක් යොදා විදුලි ජනනය කෙරෙන ජනන ධාරිතාවය සමස්ත ස්ථාවර ජනන ධාරිතාවෙන් 50% ක ප්‍රතිශතය නොඉක්මවිය යුතුය.

3.1.5 කවර හෝ අනාගත අවිනිශ්චිතතාවයන්ට මුහුණ දීම සඳහා විදුලිය මෙන්ම ඉන්ධන සැපයුම් ජාලයන්හි සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් යටිතල ව්‍යුහයෙහි ප්‍රමාණවත්භාවය සහ විශ්වසනීයත්වය සහතික කෙරේ.

3.1.6 බලශක්ති අංශයේ කාර්යසාධනයට තීරණාත්මක ලෙස බලපෑ හැකි අභ්‍යන්තර, බාහිර අවිනිශ්චිතතාවයන් හඳුනාගැනීම සහ අවම කිරීම සඳහා නිරන්තර අවදානම් ඇගයීම් සිදුකරනු ඇත.

3.1.7 ස්වාභාවික වායු වැනි දේශීය ඛනිජ ඉන්ධන සම්පත් භූ භෞතික මිනුම් මාර්ගයෙන් ගවේෂණය කොට ඛනිජඉන්ධන දත්ත ගබඩාව පෝෂණය කොට සුදුසු කාල වකවානුවලදී ඒවා උපාය මාර්ගිකව සංවර්ධනය කොට විදුලිබල ජනනය, ප්‍රවාහන, ගෘහස්ත සහ කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍ර වෙත හඳුන්වා දීමටත් හයිඩ්‍රජන් සහ වායු මගින් ද්‍රවඉන්ධන (Gas to Liquids - GTL) වැනි නවීන නිෂ්පාදනයටත් යොමු කෙරෙනු ඇත.

3.1.8 ප්‍රත්‍යක්ෂ උත්පාදන තාක්ෂණයන් සහ ඉන්ධන මූලාශ්‍ර මගින් ජාතික විදුලිබල අවශ්‍යතාවය සපුරා ගනු ඇත.

3.1.9 දිවයිනෙහි උපායමාර්ගික ස්ථානයන්හි උපායමාර්ගික ඉන්ධන සංචිත පවත්වාගෙන යෑම විදුලිබල සහ ඛනිජ තෙල් කර්මාන්තයන්හි සියලු ප්‍රධාන පාර්ශවයන්ට අනිවාර්ය කරනු ඇත.

3.1.10 විවිධ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා දිවයිනෙහි ඉල්ලුම ප්‍රශස්ත අයුරින් සපුරාලීම සඳහා දේශීය බොර තෙල් පිරිපහදු ධාරිතාවය පුළුල් කරනු ඇත.

3.1.11 විදුලිය හුවමාරු කරගැනීම සඳහා හැකියාවන් පවතින කලාපීය රටවල් සමග සහයෝගීතාවය බහුපාර්ශ්වීය විදුලි වෙළඳපොළක් මාර්ගයෙන් සාක්ෂාත් කරගැනීමට උත්සුක වනු ඇත.

**3.2 බලශක්ති සේවා සම්පාදනය**

පුරවැසියන්ගේ ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා සහ ලාභ ලබන ආර්ථික කටයුතුවල නිරතවීම සඳහා විශ්වසනීය, භාවිතයට පහසු, ගුණාත්මක බලශක්ති සේවාවන් සමානාත්මතාවයකින් යුතුව පහසුවෙන් ලබාගත හැකි වන සේ සම්පාදනය කරනු ඇත.

3.2.1 ජාලයෙන් හෝ ජාලයෙන් බැහැර ප්‍රභව භාවිතා කරමින් විදුලිය සහ නවීන ඛනිජ ඉන්ධන සඳහා ප්‍රවේශය දිවයිනෙහි සියලු පුරවැසියන් සඳහා සහතික කරනු ඇත.

3.2.2 කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගෙන් අය කරනු ලබන මූලික විදුලි සම්බන්ධතා ගාස්තුවෙන් කොටසක් විදුලි විකිණුම් මිල හරහා බෙදා දැමීමෙන් එම ව්‍යවසායන් සවිමත් කෙරේ.

3.2.3 ප්‍රවේශය ලබා ගැනීමෙන් පසුවද විදුලිය සම්බන්ධ කරගැනීමේ ගාස්තු සම්පාදනය කරගැනීමට නොහැකි වීම හේතුවෙන් විදුලි සම්බන්ධතාව ලබා නොගන්නා ගෘහයන් සඳහා නවීන මූල්‍ය ක්‍රම හරහා විදුලි සම්බන්ධතාව ලබාදෙනු ඇත.

3.2.4 කාන්තාවන් සහ තරුණයන් සවිබල ගැන්වීම පිළිබඳව අවධාරණය කරමින් කෘෂිකර්මාන්තය තුළ නව ඵලදායී විදුලි භාවිතයන් උනන්දු කරවනු ඇත.

3.2.5 යෝග්‍ය ප්‍රමිති තත්ත්වයන් හඳුන්වා දීම හරහා බලශක්ති සේවාවන් සැපයීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කරනු ඇත.

3.2.6 පොදු බලශක්ති සේවා සම්පාදනයේ ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා අවම සේවා සම්පාදන ප්‍රමිතීන් හඳුන්වා දෙනු ලැබේ. ඉහළ ප්‍රමිතීන් සඳහා වැඩි පිරිවැයක් දැරීමට කැමති පාරිභෝගිකයින් සඳහා එම ප්‍රමිතීන්වලට බලශක්ති සේවා සැපයේ.

3.2.7 ගැලපීම, සංකලනයෙහි පහසුව සහ බලශක්ති සැපයුමෙහි ආරක්ෂාව සහතික කිරීම සඳහා, බලශක්ති සැපයුම් දාමය තුළ භාවිතා කරන උපකරණ ප්‍රමිතගත කරනු ඇත.

3.2.8 ඉහළ විශ්වසනීයත්වය, වැඩි ආරක්ෂාව සහ සෙවණ ශාක සඳහා ඇති බලපෑම් අවම කිරීම යන කරුණු සළකා නාගරික ප්‍රදේශවල විදුලිය බෙදා හැරීමේ පද්ධති, ක්‍රමානුකූලව භූගත පද්ධති බවට පත්කරනු ලබන අතර, අනෙකුත් ප්‍රදේශවල යොදා ඇති විවෘත රැහැන් පරිවෘතපොකුරු රැහැන්බවට පත් කරනු ඇත.

3.2.9 කර්මාන්ත සහ ගෘහස්ත ක්ෂේත්‍ර වෙත වායු සහ ද්‍රව ඉන්ධන සම්පාදනය වැඩි දියුණු කිරීම සඳහා එම ක්ෂේත්‍ර වෙත යොදවන බෙදාහැරීම් පද්ධති පෝෂණය සඳහා නළමාර්ග මෙන්ම වාහන පාදක ප්‍රවාහන පද්ධති ද ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

3.2.10 ඉහළ පාරිභෝගික සේවා සඳහාත්, ස්වයංක්‍රීය විදුලිබල පද්ධති කළමනාකරණය සිදුකිරීම සඳහාත් සේවක මැදිහත්වීම ලාභදායක නොවන අවස්ථාවලදී සිදුකරනු ලබන සේවක මැදිහත්වීම අඩු කිරීම සඳහා සුහුරුජාල තාක්‍ෂණ හඳුන්වා දෙනු ලබන අතර සුහුරු මණු ද යොදවනු ඇත.

3.2.11 පාරිභෝගික සේවා පහසුව ඉහළ නංවීම සඳහා ජංගම දුරකථන සහ අන්තර්ජාලය පදනම් කරගත් සේවාවන් හඳුන්වා දෙනු ඇත.

**3.3 ජාතික ආර්ථිකය සඳහා ප්‍රශස්ත පිරිවැයකට බලශක්ති සේවාවන් සැපයීම**

ජාතික ආර්ථිකය මත භාරය අඩු කිරීම සඳහා සහ අන්තර්ජාතික වෙළඳපොළ තුළදී දේශීයව නිෂ්පාදිත භාණ්ඩවල තරඟකාරීත්වය සාක්ෂාත් කරගැනීම සඳහා දිගුකාලීනව පවතින ප්‍රශස්ත පිරිවැයකට බලශක්ති සේවාවන් සම්පාදනය කෙරෙනු ඇත.

3.3.1 දිගුකාලීන ජනන සැලැස්මේ හඳුනාගත් විදුලි බලාගාර සැලසුම් කළ පරිදි ක්‍රියාවට නංවනු ඇත.

3.3.2 ඛනිජ තෙල් ලබාගැනීම, සකස් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය සහ බෙදාහැරීමසඳහා වන ධාරිතා අවශ්‍යතාවයන් දීර්ඝකාලීන සැලසුම්වල හඳුනාගනු ඇති අතර ප්‍රමාණවත් ඛනිජ තෙල් සැපයුමක් සහතික කිරීම සඳහා ඒවා නියමිත කාලවලදී සංවර්ධනය කරනු ඇත.

3.3.3 ක්ෂේත්‍රයේ ආයතනවල මූල්‍ය යහපැවැත්ම සහතික කිරීමේ අරමුණින්, හානිදායක බලශක්ති භාවිතය අධෛර්යමත් කිරීම සඳහා වර්තමාන සහ නව නියාමන යාන්ත්‍රණතුළින් බලශක්ති දාම හරහා තර්කාන්විත ලෙස බලශක්ති මිල නියම කිරීමේ උපායමාර්ග යොදාගනු ඇත.

3.3.4 ස්වකීය ආර්ථික හැකියාවන් සහ ජාතික ආර්ථික සංවර්ධන ප්‍රමුඛතා සඳහා දක්වන දායකත්වය මත පදනම්ව විශේෂ සැලකිල්ලක් දැක්වීම සඳහා සුදුසු බලශක්ති භාවිතා කරන ගෘහස්ත, කර්මාන්ත සහ වාණිජ ක්ෂේත්‍රවල ඉලක්ක කණ්ඩායම් රජය විසින් හඳුනා ගෙන විනිවිදභාවයෙන් සම්පාදනය කරගනු ලබන සහනාධාර ලබාදෙනු ඇත.

**3.4 බලශක්ති කාර්යක්‍ෂමතාවය සහ සංරක්‍ෂණය වැඩි දියුණු කිරීම**

බලශක්තියෙහි කාර්යක්ෂම භාවිතය සහ සංරක්‍ෂණය සහතික කිරීම පිණිස බලශක්ති පද්ධති මනා ලෙස කළමනාකරණය සහ මෙහෙයවීම සිදු කරනු ඇත. ක්ෂේත්‍රයේ ආයතන සිට අවසන් පාරිභෝගිකයා දක්වා අදාළ සියලු අංශ විසින් මේ සම්බන්ධව කටයුතු කරන අතර, පහත දැක්වෙන උපායමාර්ග ක්‍රියාවට නංවනු ඇත.

3.4.1 ගෘහස්ත, කර්මාන්ත සහ වාණිජ අංශයන්හි සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් බලශක්ති කාර්යක්‍ෂමතා ඉහළනැංවීම සහ සංරක්‍ෂණය සම්බන්ධ ජාතික වැඩසටහනක් දියත් කරනු ඇත.

3.4.2 අවම බලශක්ති කාර්ය සාධන ප්‍රමිතිකරණය සහ උපකරණ ලේබල් කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික ආයතනයන් හි හරිත ප්‍රසම්පාදන ක්‍රියාවලි හඳුන්වාදීම තුළින් බලශක්ති කාර්යක්‍ෂමතා වැඩි දියුණු කිරීම සහ සංරක්‍ෂණය ප්‍රවර්ධනය කරනු ඇත.

3.4.3 කාන්තාවන් සවිබල ගැන්වීම අරමුණු කර ගනිමින් ගෘහස්ත බලශක්ති කාර්යක්‍ෂමතා සහ සංරක්‍ෂණය කේන්ද්‍ර කොට ගත් ගෘහස්ත ඵලදායීතා වර්ධන වැඩසටහනක් දියත් කෙරේ.

3.4.4 බලශක්ති කාර්යක්‍ෂමතාවයෙන් ඉහළ තාක්‍ෂණයන් සඳහා ආකර්ශිත වෙළඳපොළක් ඇති කිරීමේ බදු අයක්‍රම සහ දිරිදීමනා මූල්‍ය ප්‍රතිපත්ති හඳුන්වා දෙනු ඇත.

3.4.5 මනා බලශක්ති භාවිතය, කාර්යක්‍ෂමතාව සහ සංරක්‍ෂණය පිණිස ඒ පිළිබඳ විශේෂඥ සේවා සම්පාදනය මගින් බලශක්ති භාවිතා වන සියලු ක්ෂේත්‍රයන්ගේ බලශක්ති කාර්යක්‍ෂමතාව, සංරක්‍ෂණය සහ බලශක්ති පිරිවැය පාලනය ප්‍රවර්ධනය කෙරේ.

3.4.6 ජලය, සීමිත වටිනා දේශීය බලශක්ති සම්පතක් ලෙස සලකමින් කාර්යක්‍ෂම ජල භාවිතය සියලු පාර්ශවකරුවන් අතර දිරි ගැන්වෙනු ඇත.

3.4.7 විදුලි ජනන පද්ධතිවල කාර්යක්‍ෂමතාවය ඉහළ නංවනු ඇත.

3.4.8 මාර්ග භාවිතා කරන්නන්ගේ ආරක්‍ෂාව ඉහළ නංවන සහ වඩා හොඳ සෞන්දර්යාත්මක සංවේදනයක් සමගින් බලශක්ති සංරක්‍ෂණය සඳහා දායකත්වය දක්වන මාර්ග ආලෝකකරණයෙහි මනා කළමනාකරණයක් සහතික කිරීම සඳහා උපායමාර්ගික සැලැස්මක් සම්පාදනය කරනු ඇත.

3.4.9 ප්‍රධාන ඉල්ලුම් කළමනාකරණ උපායමාර්ගයක් ලෙස ස්වයංක්‍රීය ඉල්ලුම් ප්‍රතිචාර තාක්‍ෂණයන් සලකා බලනු ඇත.

3.4.10 බලශක්ති සම්පාදන ජාලයන්හි ශක්ති හානි ප්‍රශස්ත මට්ටමක් දක්වා පහළට ගෙන එනු ඇත.

3.4.11 අඛණ්ඩ තාක්‍ෂණ සංවර්ධනය සඳහා සිදුකරන නව ආයෝජන හරහා ඛනිජ තෙල් පිරිපහදුවේ අලාභයන් අවම කෙරේ.

3.4.12 බෙදා හැරීමේ ජාලයන් හි වඩා හොඳ තාක්‍ෂණයන් භාවිතා කිරීමෙන් සහ පවතින මෙන්ම නව දුම්රිය ගබඩා පහසුකම් යොදවමින් ඛනිජ තෙල් බෙදා හැරීමේදී ලබන අලාභ ප්‍රශස්ත මට්ටම් දක්වා අඩු කරනු ඇත.

3.4.13 පුද්ගලිකව පැමිණීම අවශ්‍ය නොවීම ආයතනික කාර්යසාධනයේ නව ලක්‍ෂණයක් සේ හඳුන්වාදීම සඳහා අතථ්‍ය (Virtual) කාර්යාල සහ දෘශ්‍ය මාධ්‍ය භාවිතා වන දුරස්ථ සම්මන්ත්‍රණ පහසුකම් ප්‍රවර්ධනය කෙරේ.

3.4.14 උසස් තත්ත්වයේ පොදු ප්‍රවාහන සේවා සහ සුහුරු රථවාහන කළමනාකරණ විසඳුම් පිළිබඳ දැඩි අවධානයක් සමඟින් 'වැළකීම, පරිවර්තනය සහ වැඩි දියුණු කිරීම' තුළින් ප්‍රවාහන බලශක්ති භාවිතය අඩු කරනු ඇත.

3.4.15 සුහුරු ජාල මඟින් සේවා සපයන සුහුරු නගර ලෙස හඳුනාගත්, විශේෂිත කලාපයන්හි අඩු භාණ්ඩ හා සේවා පිරිවැය සහ වැඩි දියුණුවූ ක්‍රියා තුළින් ප්‍රයෝජන ගැනීම සඳහා කේන්ද්‍රීය භෞතික ප්‍රදේශ ලෙස ආර්ථික ක්‍රියාකාරකම් සංවර්ධනය කරනු ඇත.

3.4.16 බලශක්ති ඉල්ලුම අඩු කිරීමේ අරමුණින්, නාගරික සංවර්ධනයෙහි ප්‍රමුඛ නිර්මාණ අංගයක් ලෙස තිරසර පෙදෙස් භාවිතා කරනු ඇත.

3.4.17 පැරණි ගොඩනැගිලි නවීකරණයේ දී මෙන්ම නවගොඩනැගිලි සැලසුම් කිරීමේදී ද බලශක්ති කාර්යක්‍ෂමතාව ප්‍රාථමික අවශ්‍යතාවයක් වනු ඇති අතර,ඒවායේ බලශක්ති කාර්ය සාධනය අනිවාර්ය පදනමින් ඇගයීමට ලක් කෙරෙනු ඇත.

3.4.18 සමස්ත බලශක්ති පිරිවැය අඩු කිරීම සහවිදුලි මිල තොරතුරු සන්නිවේදනය තුළින් පාරිභෝගික ඉල්ලුම වෙනස් කිරීම සඳහා සුහුරු ගොඩනැගිලි සහ සුහුරු මිණිතය සඳහා පූර්ණපරිවර්තනය වීම ඇතුළු සුහුරු ජාල තාක්‍ෂණයන් යොදවා ගැනේ.

3.4.19 වාහන සංචිතයේ කාර්යක්‍ෂමතාව ඉහළ නැංවීම සඳහා වාහන සඳහා බදු පැනවීමේදී එම වාහනවල ඉන්ධන භාවිතය ප්‍රමුඛ අංගයක් සේ සලකනු ඇත.

**3.5 බලශක්ති ස්වාධීනත්වය ඉහළ නැංවීම**

බාහිර තත්ත්වයන් නිසා බලශක්ති සැපයීමට ඇතිවන අනර්ථයන් අවම කිරීමේ අරමුණ ඇතිව සහ බලශක්ති අංශයේ ඉහළ මට්ටමේ නම්‍යශීලිතාවයක් ළඟා කර ගැනීම සඳහා තාක්‍ෂණ, ආර්ථික, පාරිසරික සහ සමාජ අවහිරතාවයන් විසඳීමට යටත්ව, ආනයනය කරන සම්පත් මත රඳා පැවතීම අවම කිරීම සඳහා දේශීය බලශක්ති සම්පත් ප්‍රශස්ත මට්ටම් දක්වා සංවර්ධනය කරනු ඇත.

3.5.1 දිවයිනෙහි ඛනිජතෙල් සහ ස්වාභාවික වායු සම්පත් ගවේෂණය කරනු ඇත. ඉහළ අනාගත වටිනාකම් සඳහා මෙන්ම අනාගතයේ හයිඩ්‍රජන් වැනි මූලාශ්‍රයන්ගෙන් බලශක්තිය ලබා ගැනීමේ හැකියාව සඳහා ලබා දිය යුතු සැලකිල්ල ලබාදෙමින් වාණිජ පරිමාණයේ උපයෝජනය උපායමාර්ගිකව සිදුකරනු ඇත.

3.5.2 පරිවර්තනය කිරීමේ තාක්‍ෂණයන් සම්පාදනය වන තෙක් වාණිජ සම්පත් විභවයක් සහිත තෝරියනයිට් වැනි දේශීය ඛනිජ සම්පත් සහ ඒ හා සමාන වෙනත් න්‍යෂ්ටික ඉන්ධන ගවේශණය කර, ඇගයීම කර සංවර්ධනය කිරීම සඳහා සූදානම් කර තබනු ඇත.

3.5.3 ආර්ථික, තාක්‍ෂණ සහ ගුණාත්මකභාවයන් සළකා සකස් කරගත් ප්‍රමුඛතා අනුපිළිවෙළ පදනම් කර ගනිමින් පුනර්ජනනීය බලශක්ති සම්පත් උපයෝජනය කරනු ඇත.

3.5.4 නිර්දේශිත ජෛවස්කන්ධ බලශක්ති සංවර්ධන ප්‍රදේශයන්හි කැප කළ බලශක්ති වගාවන් පිහිටුවීමෙන් ජෛවස්කන්ධ සැපයීම ඉහළ නංවනු ඇත. කර්මාන්ත තාප බල යෙදවුම් සහ ගෘහයන්හි පරිභෝජනය සඳහා ජෛවස්කන්ධ සහ ජෛවස්කන්ධ පදනම් කරගත් ඉන්ධන නිෂ්පාදනවල වාණිජසැපයුම් උනන්දු කරවනු ඇත. පවතින සම්පත් කාර්යක්‍ෂමව එක්රැස් කිරීම, සකස් කිරීම, අගය එක් කිරීම, ගබඩා කිරීම සහ සැපයුම් දාම පෝෂණයතුළින්,සකස් කරන ලද ජෛව ස්කන්ධ ඉන්ධන මූලාශ්‍රයක් ලෙස භාවිතය සඳහා සහාය දක්වනු ඇත.

3.5.5 ආහාර පිසීමේ කටයුතු සඳහා යොදා ගන්නා ඉන්ධනයක් ලෙස ජෛවස්කන්ධවල භූමිකාව ඉදිරියටත් පවත්වා ගැනීම සඳහා සහ වාණිජ ඛනිජ ඉන්ධන කරා යොමුවීම වැළැක්වීම සඳහා පහසුවෙන් භාවිතයට ගත හැකි වැඩි දියුණු කළඋඳුන් වැනි උපකරණ ප්‍රවර්ධනය කරනු ඇත. පහසුව තකා වාණිජ ඉන්ධන වෙත ආකර්ශණය වන ගෘහස්ත ක්ෂේත්‍රය දර භාවිතයේ රඳවා ගැනීමට මෙමඟින් අපේක්ෂිතය.

3.5.6 වර්තමානයේ ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් භාවිතයට ගන්නා දුම්රිය සහ මාර්ග ප්‍රවාහන බලශක්තිය ක්‍රමිකව විදුලිය කරා විවිධාංගිකරණය කිරීම උනන්දු කරනු ඇති අතර, එමඟින් සමස්ත පරිවර්තන කාර්යක්ෂමතාවය වැඩි දියුණු වන්නා සේම, ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඛනිජ ඉන්ධන මත රඳා පැවැත්ම ද අඩු කරනු ඇත. කාලපාදක අයකුම භාවිතා කිරීමෙන් විදුලි ඉල්ලුම අවම කාලපරිච්ඡේද වෙත විදුලි රිය ආරෝපණ ඉල්ලුම ආකර්ශනය කිරීමටත්, එමඟින් සුළං සහ සූර්ය බලශක්තිය වැනි දේශීය බලශක්ති මූලාශ්‍ර විදුලි පද්ධතියට වැඩිමනක් අන්තර්ග්‍රහණය කිරීමටත් අපේක්ෂා කෙරේ.

3.5.7 ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ ප්‍රතිපාදන අනුවඛනිජ ඉන්ධන සඳහා සෙස් බද්දක් අයකිරීම සහ පුනර්ජනනීය බලශක්ති සම්පත්වලින් රාජ්‍ය භාගයක් අයකර ගැනීමේ විධිවිධාන ක්‍රියාවට නැංවීමෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලට සැලකිය යුතු අරමුදලක් යොමු කරනු ඇත. සුනිත්‍ය බලශක්ති, විදුලි සහ ඛනිජ තෙල් ක්ෂේත්‍රයන්හි අවශ්‍යතා සපුරාලීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලේ අරමුණ පුළුල් කෙරෙනු ඇත.

3.5.8 තාප බලශක්ති අවශ්‍යතාවයන් සඳහා ජෛව ස්කන්ධ සම්පාදනයේ ප්‍රමුඛස්ථානය හොබවන රබර් වගා පිළිබඳ නිසි අවධානය යොමුකොට එම වගාබිම් වපසරිය වැඩිකිරීම දිරිගන්වනු ඇත.

**3.6 පරිසරය සුරැකීම**

පහතඋපායමාර්ග අනුගමනය කරමින් අඩු විමෝචන ක්‍රියාවලි සහ විමෝචන අඩු කිරීමේ ක්‍රියාමාර්ග තුළින් රටේ ස්වාභාවික පරිසරය ආරක්ෂා කරනු ඇති අතර, කාලගුණික විපර්යාස සංසිද්ධිය සඳහා අර්ථාන්විත ප්‍රතිචාර දක්වනු ඇත.

3.6.1 අංගාර තිර කිරීමේ වගාවන් වැනි ප්‍රතිසංතුල මැදිහත්වීම් භාවිතා කරමින් බලශක්ති පද්ධතිවලින් සිදුවන පාරිසරික බලපෑම් අවම කිරීම සහ විමෝචන අඩු කිරීම සිදුකරනු ඇත. ජලවිදුලි බලාගාරවල පෝෂක ප්‍රදේශ සහ අනාගත බලශක්ති යටිතල පහසුකම් සඳහා වෙන් කළ ඉඩම් ද මේ වගාවන් සඳහා සලකා බැලෙනු ඇත.

3.6.2 බලශක්ති සංවර්ධන ව්‍යාපෘතිසම්බන්ධ කැණීම් කටයුතු සහ මෙහෙයුම් නිසා කාලගුණික විපර්යාස සංසිද්ධියට බලපාන පාරිසරික බලපෑම් අවම කරනු ඇත.

3.6.3 ජාතික ආර්ථිකය මත බලපෑම සහ දීර්ඝකාලීන පාරිසරික ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් දේශීය සහ ගෝලීය පරිසරයට සිදුවන හානිය අවම කිරීම සඳහා,පිවිතුරුමූලාශ්‍රයන්ගෙන් සහ තාක්ෂණයන්ගෙන් සිදු කරනු ලබන බලශක්ති සැපයුම උනන්දු කරනු ඇත.

3.6.4 ප්‍රමාණවත් පාරිසරික ආරක්ෂක විධිවිධාන සමඟින්, දේශීය ඛනිජ තෙල් සහ න්‍යෂ්ටික බලශක්ති සම්පත් වෙළඳපොලක් නිර්මාණය කර ප්‍රශස්ත මට්ටම් දක්වා සංවර්ධනය කරනු ඇත.

3.6.5 හමන අළු සහ අපතේ යන තාපය වැනි වාණිජ වටිනාකමක් සහිත බලශක්ති සම්පාදනයේ අතුරුඵල පරිභෝජනය කිරීම සඳහා ජාතික මට්ටමේ සැලසුම් සකස් කරනු ඇත.

3.6.6 එකඟවී ඇති පරිදි ජාතික වශයෙන් තීරණය කරන ලද විමෝචනහරණ මඟින් ගෝලීය විමෝචන අවම කිරීමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා දායක වනු ඇත.

3.6.7 බලශක්ති ක්ෂේත්‍රයේ තීරණ ගැනීමේ දී දේශීයව බලපාන බාහිර සමාජීය සහ පාරිසරික සාධක පිළිබඳ අධ්‍යයනය කර, ඒවා අදාළතීරණ ගැනීම සඳහා පාදක කරගනු ඇත.

3.6.8 අංගාර වෙළඳාම පිළිබඳ යාන්ත්‍රණතුළගැබ්ව ඇති අවස්ථා හඳුනා ගනිමින් එම අවස්ථා ප්‍රයෝජනයට ගැනීමට නිසි ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ඇත.

3.6.9 අපද්‍රව්‍ය මගින් බලශක්ති සම්පාදනය කිරීමේ ව්‍යාපෘතිවල ඇති හැකියාව සලකා බලා එම ව්‍යාපෘති දිරිමත් කෙරෙනු ඇත. නාගරික අපද්‍රව්‍ය මගින් විදුලිය නිපදවීමේ දී විදුලි ජනන හරහා ඉතිරිවන පිරිවැයට වැඩිමනත් පිරිවැය විදුලිබල ආයතනවලට බරක් නොවීම පිණිස රජය/පළාත් පාලන ආයතන විසින් ව්‍යාපෘති සංවර්ධකයින්ට සෘජුවම ගෙවනු ඇත.

3.6.10 නිසි සෞඛ්‍ය, ආරක්ෂක සහ පාරිසරික ප්‍රමිතීන් හඳුන්වා දී ඒවා නීතිගත කොට එම සම්මතයන්ගෙන් බැහැරව බලශක්ති ක්ෂේත්‍රයේ පර්යන්ත හෝ වෙනත් යටිතල පහසුකම් භාවිතා කිරීම නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදක් බවට පත් කෙරෙනු ඇත.

**3.7 පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහළ නැංවීම**

දේශීය ප්‍රජාව බලශක්ති කර්මාන්තයේ නිරත කරවීමේ සහ තිරසාරත්වය ළඟා කරගැනීමේ අරමුණ ඇතිව, පහත දැක්වෙන උපාය මාර්ග අනුගමනය කිරීමෙන්, පරිසර හිතකාමී බලශක්ති මූලාශ්‍ර භාවිතය ප්‍රවර්ධනය කිරීමේ පියවරක් ලෙස විදේශ විනිමය පීඩනය අඩු කිරීම සඳහා දිවයිනෙහි බලශක්ති සැපයුමේ පුනර්ජනනීය බලශක්ති සම්පත්වලින් ඇති දායකත්වය වැඩි කරනු ඇත.

3.7.1 කේන්ද්‍රීය සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් මගින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමැතිය සඳහා වැයවන දීර්ඝකාලය අවම කෙරෙනු ඇත.

3.7.2 වියදම අඩු කිරීමටත් පුළුල් ආයෝජක සහභාගීත්වයක් සාක්ෂාත් කරගැනීම පිණිසත් තරඟකාරී ක්‍රමවේද හරහා පුනර්ජනනීය බලශක්ති ආයෝජන සම්පාදනය කරගනු ඇත.

3.7.3 පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් ජනනය කරනු ලබන විදුලිය පද්ධතියට ලබාගැනීම වැඩිකිරීම සඳහා සම්ප්‍රේෂණ යටිතල ව්‍යුහය ශක්තිමත් කරනු ඇත.

3.7.4 විසිරුණු ජනනය සඳහා ඉඩ ලබාදීම පිණිස සුහුරු ජාල තාක්ෂණයන් සමඟින් බෙදාහැරීමේ යටිතල ව්‍යුහය උත්ශ්‍රේණිගත කරනු ඇත.

3.7.5 සුළං සහ සූර්ය බලශක්තිය වැනි විචල්‍ය පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් ජනනය කරන විදුලිය විදුලිබල පද්ධතියට අවශෝෂණය කිරීමේ දී ඇතිවන තාක්ෂණික ගැටළු විසඳා ගැනීම සඳහා පර්යේෂණ සිදුකරනු ඇත.

3.7.6 පුනර්ජනනීය බලශක්ති සම්පත්ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම සඳහා සුළං, සූර්ය බලය සහ වර්ෂාපතනය සඳහා ඵලදායී පුරෝකථන තාක්ෂණයන් හඳුන්වාදෙනු ඇත.

3.7.7 ක්ෂණික වෙනස්වීම්වලට භාජනය වන පුනර්ජනනීය විදුලි ජනනය ස්ථාවරව පවත්වාගෙන යාමටත්, වෝල්ටීයතා සහ සංඛ්‍යාත පාලනයටත්, ප්‍රාදේශීය ජාලවල විදුලිය මනාව පවත්වා ගැනීමටත් දිනයේ යම් කාලසීමාවල ඇතිවන අධික ඉල්ලුම පාලනය කිරීමටත් ජාලයේ දැරීමේ හැකියාව වැඩිකිරීමටත් විදුලි කෝෂ තාක්ෂණය යොදා ගනු ලැබේ.

3.7.8 රාජ්‍ය සහ පෞද්ගලික ව්‍යවසායන් සම්බන්ධ කොට ගෙන පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා අවශ්‍ය නව්‍ය මූල්‍ය උපකරණ හඳුන්වා දෙනු ලැබේ.

**3.8 බලශක්ති ක්ෂේත්‍රයේ යහපාලනය ශක්තිමත් කිරීම**

බලශක්ති ක්ෂේත්‍රයේ සියලු අංශයන්ට මඟ පෙන්වන මූලධර්මය යහපාලනය වනු ඇත. බලශක්ති ක්ෂේත්‍රයේ යහපාලනය සහතික කිරීම සඳහා ස්ථාවර ප්‍රතිපත්ති රාමුවක් ඇති කරනු ලබන අතර, නියාමන රාමු අලුතින් හඳුන්වා දී පවතින රාමු තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

3.8.1 බලශක්ති ක්ෂේත්‍රයේ සියළු උපක්ෂේත්‍රයන් අදාළ නියාමන රාමු යටතට ගෙන එනු ලැබේ.

3.8.2 විනිවිදභාවය සහ වගවීම සහතික කරමින් පිරියත, උපකරණ, බොර තෙල් සහ වෙනත් ඉන්ධන ප්‍රසම්පාදනය මෙන්ම විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් සහ එවැනි ප්‍රදානයන්ප්‍රමාදවීම මගහැර, ඵලදායී තරඟකාරී ලංසු ක්‍රමවේද හරහා සිදු කරනු ඇත.

3.8.3 විදේශ රටවල සමාන ආයතන අතර හුවමාරු වැඩසටහන් සඳහා පහසුකම් සැපයීමෙන් සහ ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ ආයතන අතර හුවමාරු පත්කිරීම් සිදු කිරීමෙන්,ඉදිරියේදී එන තරඟකාරී පරිසරයේ අභියෝගයන්ට මුහුණ දීම සඳහා බලශක්ති ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ දක්‍ෂතා ඉහළ නංවනු ඇත.

3.8.4 සමස්ත බලශක්ති සේවාදාමයේ වත්කම් කාර්යක්‍ෂමව, විනිවිදභාවයෙන් යුතුව මෙන්ම ප්‍රශස්ත මට්ටමකින් උපයෝජනය සඳහා සුහුරු මණු, ඇමතිය හැකි උපාංග හා උපකරණ සහ සුහුරු ජාල යොදා ගනු ලැබේ. කෘතිම බුද්ධිය, අන්තර්ජාලගත උපකරණ සහ විසිරුණු ගිණුම් ප්‍රකාශන වැනි නවීන සංකල්ප භාවිතය පිණිස ව්‍යාවසායගත සම්පත් සැලසුම් (Enterprise Resource Planning -ERP) මෘදුකාංග පාදක පරිගණක ගතකිරීම ප්‍රමුඛතාවක් සේ ගැනෙනු ඇත.

3.8.5 බලශක්ති ක්ෂේත්‍රයේ පරිගණක දත්ත ගබඩා කිරීම, භාවිතය සහ කළමනාකරණය ද ආවරණය වන පරිදි එම දත්ත සුරැකීම පිණිස පරිගණක දත්ත කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශයක් හඳුන්වා දෙනු ඇත.

3.8.6 බලශක්ති ක්ෂේත්‍රයේ ගනුදෙනු මධ්‍යම අවකාශගත දත්ත ගබඩා භාවිතයෙන් පරිගණක ගතකොට එසේ සම්පාදිත දත්ත, තොරතුරු සහ දැනුම අනාගත භාවිතය සඳහා ආරක්‍ෂාකාරීව ගබඩා කර තබන අතර, දැනුම් වත්කම් ලෙස සලකනු ඇත.

3.8.7 පරිගණකගත දත්ත යොදාගනිමින් සිදුකරන විශ්ලේෂණ හරහා තත්කාලීන යථාවබෝධයෙන්, විනිවිදභාවයකින් සහ වගවීමෙන් ස්වාධීන තීරණ ගැනීම සඳහා උපකාරී වන වටපිටාවක් ගොඩනංවනු ඇත.

3.8.8 බලශක්ති ක්ෂේත්‍රයේ ආයතන එහි සියලු ගනුදෙනු හා සිදුවීම් නියමිත වාර්ෂික කාල සටහනකට අනුව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත වාර්තා කිරීමට අවශ්‍ය යාන්ත්‍රණයක් සහ අදාළ ආයතනවල නිලධාරීන්ගෙන් සැදුම්ලත් ක්‍රියාකාරී කණ්ඩායමක් පත්කෙරෙනු ඇත. මෙමගින් ශ්‍රී ලංකා බලශක්ති තුලනය කාලීනව ප්‍රකාශයට පත්කිරීම සහතික කෙරේ.

3.8.9 සාක්ෂි පදනම් කරගත් තීරණ ගැනීමකට සහාය දැක්වීම සඳහා බලශක්ති ක්ෂේත්‍රයේ නැඹුරුතා වටහා ගැනීම වැඩිදියුණු කළ හැකි දර්ශක හඳුනාගෙන ජාතික සංඛ්‍යා ලේඛනවලට ඇතුළත් කරනු ඇත.

3.8.10 බලශක්ති ක්ෂේත්‍රයේ ව්‍යාපෘති වෙත ඉහළ පිළිගැනීමක් සහ බලශක්ති සේවාවල දියුණු පරිභෝජක රටාවන් ද ඉලක්ක කර ගනිමින් මහජන විශ්වාසය දිනා ගැනීම, දැනුවත් කිරීමසහ අධ්‍යාපනය මගින් බලශක්ති ක්ෂේත්‍රයෙහි පුරවැසියන්ගේ ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම පිණිස වෙබ් අඩවියක් පාදක කොට නිර්මාණය කරන ජංගම දුරකථන යොමුවක් හඳුන්වා දෙනු ඇත.

**3.9 අනාගත බලශක්ති යටිතල ව්‍යුහ සඳහා ඉඩම් සුරක්ෂිත කිරීම**

සමහර තාක්‍ෂණයන් සංවර්ධනය කිරීම සඳහා විශේෂිත ලක්‍ෂණ සහිත ඉඩම්වල සීමාසහිත බව සැලකිල්ලට ගනිමින් සහ විදුලි බලාගාර ස්ථානගත කිරීම් වෙනස් කිරීම හේතුවෙන් අතීතයේ සිදුවූ විශාල අලාභ සලකා බලමින්, එවැනි ව්‍යාපෘති නියමිත කාලවලදී ක්‍රියාවට නැංවීම සහතික කිරීම සහ අහිතකර සමාජ බලපෑම් අවම කිරීම සඳහා අනාගත බලශක්ති යටිතල ව්‍යුහ පිහිටුවීමේ උපායමාර්ගික ස්ථාන කල් ඇතිව සලකුණු කර ආරක්‍ෂා කරනු ඇත.

3.9.1 සංවර්ධනය සිදු කරන කාලයේ දී නැවත පදිංචි කිරීම් අවම වන පරිදි සහ අවම සමාජ බලපෑමක් ඇතිවන පරිදි මහජනතාවට අදාළ භූමි භාග භාවිතයට ගැනීමෙන් වැළකී සිටිමට හැකි වන පරිදි ගල් අඟුරු, ස්වාභාවික වායු සහ න්‍යෂ්ටික බලාගාර, පිරිපහදු ස්ථාන සහ පර්යන්ත වැනි අනාගත බලශක්ති යටිතල ව්‍යුහ ස්ථානගත කිරීම සඳහා සුදුසු භූමිභාග මූලික ශක්‍යතා අධ්‍යයනයන්ට පසුව කල් ඇතිව උපායමාර්ගිකව සලකුණු කර වෙන්කර තබනු ඇත.

3.9.2 අඩියර වශයෙන්,කේන්ද්‍රගත ලෙස සහ මහා පරිමාණයෙන් සංවර්ධනය කළ හැකි වන පරිදි සුළං සහ සූර්ය බලශක්ති මූලාශ්‍ර සඳහා යටිතල ව්‍යුහ ස්ථානගත කිරීමට ප්‍රශස්ත භූමිභාග කල් ඇතිව හඳුනාගෙන ඒවා ප්‍රධාන සැලැස්මක සලකුණු කර තබනු ඇත.

3.9.3 ජාතික යටිතල ව්‍යුහ සැලසුම් කිරීමේ ප්‍රයෝජනය සඳහා පොදුවේ භාවිතා කළ හැකි සම්ප්‍රේෂණ මාර්ග සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් ඛනිජ තෙල්, නල වායු ප්‍රවාහන සහ ප්‍රධාන විදුලි සම්ප්‍රේෂණ මාර්ග හඳුනාගනු ඇති අතර, එමගින් එවැනි ස්ථාන තුළ කවර හෝ සංවර්ධනයක් සිදුවන්නේ නම් මහජනතාවට කල් ඇතිව තොරතුරු ලබාදීම පිණිස ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

3.9.4 හැකි සෑම අවස්ථාවකම බහු සම්ප්‍රේෂණ නළ සහ රැහැන් මාර්ග එලීම සඳහා පවතින ප්‍රවේශ මාර්ග භාවිතයට ගනු ඇත.

3.9.5 අනාගත භූගත රැහැන් මාර්ග සහ නල මාර්ග සඳහා ප්‍රශස්ත ස්ථාන සොයා ගැනීමට පහසුකම් සැපයීම සඳහා විදුලිය, ජලය, සන්නිවේදන, නාගරික වායු සහ ඛනිජ තෙල් ඇතුළු සියළු පවතින සහ අනාගත භූගත යටිතල ව්‍යුහ පොදු භූ තොරතුරු පද්ධතියක දත්ත ලෙස අනිවාර්යයෙන් ඇතුළත් කෙරෙනු ඇත.

3.9.6 හිමිකාරිත්වයේ පැහැදිලි සලකුණු, නඩත්තු කිරීමේ පහසුව, පුළුල් කිරීමේ ඉඩකඩ සහතික වන ආකාරයට, විදුලිය බෙදාහැරීම්, මළාපවහන, ජලය, සන්නිවේදන සහ වායු සැපයුම් ඇතුළත් වන මාර්ග ආශ්‍රිත යටිතල ව්‍යුහ, ප්‍රවාහන යටිතල ව්‍යුහ සමඟ සම්බන්ධීකරණය කෙරෙනු ඇත.

**3.10 නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය සඳහා අවස්ථාවන් ලබාදීම**

තාක්‍ෂණ තීව්‍ර දේශීය කර්මාන්ත බිහි කිරීම සඳහා මහා පරිමාණ වෙළඳපොළ සලකා බැලීමේදී බලශක්ති ක්ෂේත්‍රයේ විශාලත්වය සැලකිය යුතු තරම්ය. මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් දේශීය ව්‍යවසායකත්වය සහ නවෝත්පාදනය සඳහා අවස්ථා සැලසීමට පහත සඳහන් ක්‍රමෝපායයන් යොදා ගනු ලැබේ.

3.10.1 ප්‍රමුඛ අනාගත බලශක්ති වාහකය ලෙස විදුලියෙහි කාර්යභාරය හඳුනා ගනු ඇති අතර බලශක්ති පරිවර්තන සහ ගබඩාකරණ උපකරණයන්හි දේශීය සම්පත් භාවිතා කරන උපායමාර්ගික ව්‍යාපාර, කාර්මිකකරණ ව්‍යාපාරයන් ලෙස පෝෂණය කරනු ඇත.

3.10.2 නවීන තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ යෙදවුම් සංවර්ධනය කිරීමෙන් විදුලි පද්ධති පාලනය ස්වයංක්‍රීය කිරීමටත්, දුරස්ථ පාලනයටත්, විසිරුණු දත්ත සහ සිදුවීම් ග්‍රහණයට සහ සුහුරු මිණිතයටත් මං සලසනු ඇත.

3.10.3 බලශක්ති ක්ෂේත්‍රයේ යටිතල ව්‍යුහ සංවර්ධනයෙහි නියැලීම සඳහා ශ්‍රී ලාංකික ව්‍යවසායන් උනන්දු කරවනු ඇත.

3.10.4 නව සහ අනාගත පුනර්ජනනීය බලශක්ති ප්‍රභව සහ කාර්යක්‍ෂම බලශක්ති පරිවර්තන සහ භාවිතා තාක්‍ෂණ හඳුන්වා දීම, අනුගමනය කිරීම සහ ක්‍රියාවට නැංවීම පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන ප්‍රවර්ධනය කරනු ඇත.

3.10.5 බුද්ධිමය දේපළ සඳහා ආරක්‍ෂාව ලබාදීමෙන්,වාණිජකරණය වනතුරු ඒවා ආරක්‍ෂාකාරීව තබා ගැනීමෙන්, මූල්‍ය දිරිගැන්වීම්හා බදු ප්‍රතිලාභ ලබාදීමෙන් සහ අංකුර තාක්‍ෂණ පෝෂණය කිරීමෙන්, නවෝත්පාදනය සඳහා පහසුකම් සපයනු ඇත.

3.10.6 බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා අවශ්‍ය වන දේශීය දැනුම සහ ධාරිතාවයන් සාක්ෂාත් කරගනු ඇත.

3.10.7 ඉල්ලුම් පාලන මෙවලමක් ලෙස, හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි විදුලි සැපයුමක් ලෙස මෙන්ම, ස්වයංක්‍රීය ඉල්ලුම් ප්‍රතිචාර විකල්පයක් ලෙසද විදුලි වාහන සතුව ඇති කෝෂ පද්ධතිවලින් ලබාදිය හැකි දායකත්වය පිළිබඳ අධ්‍යයනය කෙරේ.

3.10.8 දේශීය අගය එක් කිරීම හරහා ආර්ථික සංවර්ධනයට දායක විය හැකි ප්‍රමුඛ කර්මාන්ත ලෙස ජාලගත විසිරුණු පුනර්ජනනීය බලශක්ති යෙදවුම් සහ මධ්‍යම ජාලයෙන් බැහැර වූ විදුලි ජනන තාක්‍ෂණ සංවර්ධන කටයුතු දිරිගැන්වෙනු ඇත.

**4. කාර්යසාධන කාල රාමුව**

ඉලක්ක සහ අපේක්ෂිත ප්‍රතිපත්ති අභිප්‍රායන් සමඟ සම්බන්ධිත විය හැකි කාල රාමු සහ ප්‍රතිපත්ති අභිප්‍රායයන් සාක්ෂාත් කර ගැනීමේ වගකීම් පැවරීම මෙම ඡේදයෙන් විස්තර කරනු ලැබේ. මෙම ඡේදය යටතේ දක්වා ඇති ඉලක්ක, සංධිස්ථාන සහ ආයතනික වගකීම්, වගකීම පවරා ඇති එක් එක් ආයතන විසින් දෙවසරකට වරක් සමාලෝචනය කළ යුතුය.මෙහි දක්වා ඇති කාර්යසාධන කාල රාමුව අනාගත කාලය සඳහා යෝග්‍ය පරිදි ප්‍රතිශෝධනය කළ හැකිය

| | | වගකීම |
|---|---|---|
| **4.1** | **බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම්**<br>බලශක්ති සුරක්ෂිතතාවය අත්පත් කර ගැනීම පිණිස හඳුනාගත් උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් පවරා ඇති ආයතන විසින් මතු සඳහන් ඉලක්ක සහ සංධිස්ථාන සාක්ෂාත් කර ගත යුතුවේ. | |
| 1a | කලාපයේ පවතින රටවල් සමඟ මායිම් හරහා විදුලිය සම්ප්‍රේෂණය කිරීමේ ආර්ථික ශක්‍යතාවය 2021 වර්ෂය අවසන් වන විට අධ්‍යයනය කර ලේඛනගත කරනු ඇත. | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |
| 1b | 2020 වර්ෂය අවසන් වන විට සපුගස්කන්ද ඛනිජ තෙල් පිරිපහදුව විශාලනය කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය කොට එහි ප්‍රශස්ත ධාරිතාව තීරණය කරනු ඇත. ඒ සමඟම ශ්‍රී ලංකාව සඳහා දෙවැනි පිරිපහදුවක් ඉදිකිරීම පිළිබඳ මූලික අධ්‍යයනය වසර 2021 වර්ෂයේ මැද භාගයේදී ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් අරඹනු ලැබේ. | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව |
| 1c | ඛනිජතෙල් උප අංශයේ සෑම ආයතනයක්ම සහ ජාල සම්බන්ධිත තාප බලාගාර එක්ව ඕනෑම අවස්ථාවක අවම වශයෙන් දින 30ක පරිභෝජනයට සමාන උපායමාර්ගික ඉන්ධන සංචිතයක් පවත්වාගෙන යා යුතුය. එක් එක් පාර්ශ්වය විසින් සකස් කළ යුතු සහ නඩත්තු කළ යුතු දේශීය ගබඩා ධාරිතාවය සඳහා ඉලක්ක පිළිබඳ එකඟවීම සඳහා ඛනිජ තෙල් නීතිගත සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය ඒකාබද්ධව වගකිව යුතුය. සියලු අනාගත විදුලි බලාගාර පිරිවිතරවල දේශීයව පවත්වාගෙන යා යුතු ගබඩා ධාරිතාවයන් ඇතුළත් විය යුතුය. | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව/ලංකා විදුලිබල මණ්ඩලය |
| 1d | බලශක්ති ක්ෂේත්‍රයේ කාර්ය සාධනය කෙරෙහි තීරණාත්මක බලපෑම් එල්ල කළ හැකි අභ්‍යන්තර සහ බාහිර අවිනිශ්චිතතාවයන් පිළිබඳව සොයාබැලීම සඳහා ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ ප්‍රමාණවත් නියෝජනයක් සමඟින් 'බලශක්ති ක්ෂේත්‍ර අවදානම් ඇගයීමේ මණ්ඩලය' ලෙස නම් කරනු ලබන උසස් මට්ටමේ ස්ථාවර කාරක සභාවක් 2019 වර්ෂය අවසන් වන විට පිහිටුවීමට නියමිතය. මෙම කමිටුවට අවදානම් ඇගයීම විෂය පිළිබඳ විශේෂඥයන් ද ඇතුළත් විය යුතු වන අතර එවැනි අවදානම් හඳුනා ගන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් ඔවුනට මනා පුහුණුවක් ලබාදෙනු ඇත. මෙම මණ්ඩලය වරින් වර රැස්විය යුතු වන අතර සම්භාවිතා-බලපෑම් විශ්ලේෂණ පදනම් කර ගනිමින් එවැනි අවිනිශ්චිතතා හඳුනාගෙන ඒවායේ බලපෑම් අඩු කිරීම පිණිස සැලසුම් සකස් කිරීම සඳහා ක්ෂේත්‍රයේ ආයතනවලට උපදෙස් ලබාදිය යුතුය. මෙම මණ්ඩලය පත්කිරීම සහ කැඳවීම සම්බන්ධයෙන් විදුලිබල විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් වගකීම දැරිය යුතුය. | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |
| 1e | 2020 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ පිළිවෙලින් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් පුනර්ජනනීය සහ පුනර්ජනනීය නොවන දේශීය බලශක්ති සම්පත් තොග ලේඛන සකස් කර ප්‍රකාශයට පත් කරනු ඇත. ගුවන් මිනුම් මාර්ගයෙන් ගුරුත්ව සහ චුම්භක ක්ෂේත්‍ර දත්ත 2019 දී ද ද්විමාන හා ත්‍රිමාන භූ කම්පන දත්ත යොදා ගනිමින් මන්නාරම් සහ කෝවේරි ද්‍රෝනි 2022 දි ද සිතියම් ගත කෙරෙනු ඇත. | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාංශය |

| | |
|---|---|
| වගකීම | **4.2 බලශක්ති සේවාවන් සඳහා ප්‍රවේශය ලබාදීම**<br>සියළු පුරවැසියන්ගේ ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා මෙන්ම ප්‍රතිඵලදායී ආර්ථික කටයුතුවල නිරතවීම සඳහා විශ්වාසනීය, භාවිතයට පහසු, සමානාත්මක සහ ගුණාත්මක බලශක්ති සේවාවන් දැරිය හැකි මිලකට ලබාදීම සඳහා වන ප්‍රවේශ ලබාදීම පිණිස පහත දැක්වෙන ඉලක්ක ඒ ඒ වගකිව යුතු ආයතන විසින් ළඟාකර ගත යුතුය. |
| ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පුද්ගලික) සමාගම | 2a අනාගත කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ ව්‍යාපාර දිරිගැන්වීම සඳහා, ව්‍යාපාරයේ ප්‍රාග්ධනය හා සැසඳීමේදී වර්තමානයේ සැලකිය යුතු අගයක් වන මූලික විදුලි සම්බන්ධතා ගාස්තුව විශේෂ සහනාධාර ක්‍රමවේදයක් හරහා අඩු කරනු ඇති අතර 2020 වසරේදී100kVAට වඩා අඩු කොන්ත්‍රාත් ඉල්ලුමක්/ගාස්තු සඳහා ට්‍රාන්ස්ෆෝමරයේ සම්පූර්ණ පිරිවැය කපා හැර විදුලි බෙදාහැරීම් හරහා සමාජගත කරනු ඇත. මෙය ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් 2021 වර්ෂයේ ආරම්භයේ සිට ක්‍රියාවට නංවනු ඇත. මේ සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි පෞද්ගලික සමාගම සහ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ජනමාධ්‍ය ඔස්සේ පුළුල් ප්‍රචාරයක් ලබා දීමට නියමිතය. |
| ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පුද්ගලික) සමාගම | 2b නව විදුලි සැපයුමක් ලබාදීමේදී එයට අවශ්‍ය යටිතල පහසුකම් සඳහා සියලු පාරිභෝගික කාණ්ඩවලින් අයකර ගන්නා මූලික සම්බන්ධතා ගාස්තු වසර 2022 අවසානයේ සිට මුළුමනින්ම නවතනු ඇත. බෙදාහැරීම් ගාස්තු හරහා එම වියදම් ප්‍රතිපූරණය කර ගැනේ. මේ හරහා 'ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව' දර්ශකයේ ශ්‍රී ලංකා ශ්‍රේණිය 50ට අඩු ස්ථානයකට ගෙන ඒමට අපේක්ෂිතය. |
| ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පුද්ගලික) සමාගම | 2c විශේෂ ගාස්තුවක් ගෙවීමෙන් ගෘහ හෝ වෙනත් පාරිභෝගිකයෙකු සඳහා විකල්ප 'එක්දින' ගෘහස්ත සේවා සම්බන්ධතාවයන් ලබාදීමට 2020 වර්ෂය මැද භාගයේදී කටයුතු සලසනු ඇත. මෙලෙස ම පිරිවැය ප්‍රතිපූරණ පදනමින් සම්පාදනය කෙරෙන වෙනත් සේවා ද අවශ්‍ය පාරිභෝගිකයින් වෙත විශේෂ ගාස්තුවක් ගෙවා කඩිනමින් ලබා ගැනීමට හැකි වනු ඇත. සාමාන්‍ය සේවා සඳහා ගතවන කාලය මහජන උපයෝගීතා කොමිසම විසින් පනවන ලද වාණිජ ප්‍රමිතීන් මත පදනම් වනු ඇත. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 2d සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වැඩසටහනක් ලෙස වසර 2020 2020-2023 කාලය තුළ හෙක්ටයාර 20,000 ක වගා මගින් කර්මාන්ත තාප යෙදවුම් සහ ගෘහස්ත පරිභෝජනය සඳහා සැපයෙන දැව ඉන්ධන ප්‍රමාණය දෙගුණයක්,එනම් වසරකට ටොන් දශලක්ෂයක් දක්වා වර්ධනය කෙරේ. මේ සඳහා දැව ඉන්ධන වගා සහ වෙනත් වාණිජ වගා මගින් දැව ඉන්ධන සැපයීමේ නිරතවන්නන් හට රජය විසින් ඉඩම්,සහන ණය සහ බදු සහනාධාරලබා දීමට නියමිතය. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 2e ගෘහස්ත භාවිතය සඳහා වැඩි දියුණු කළ, භාවිතයට පහසු, වාණිජ ජෛවස්කන්ධ නිෂ්පාදන සහ පරිවර්තන තාක්ෂණ උනන්දු කරවීම සඳහා උඳුන් සහ ක්ෂුද්‍ර වායු ජනක වැනි තාක්ෂණ නිෂ්පාදනය කිරීමේ සහ බෙදාහැරීමේ නිරතව සිටින ව්‍යවසායකයන් සඳහා 2020 වර්ෂය අවසන් වීමට පෙර මූල්‍ය දිරිගැන්වීම් ලබාදීම සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සහතික කරනු ඇත. 2021 වර්ෂය වන විට වාණිජකරණය වූ ඉන්ධන භාවිතා කරන වැඩි දියුණු කළ උඳුන් අවම වශයෙන් 5%ක ව්‍යාප්තියක් සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සහතික කළ යුතුය. |
| ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසන් සභාව | 2f ඛනිජතෙල් සපයන්නන් මගින් ඉන්ධනවල ගුණාත්මක ප්‍රමිත නිශ්චය කිරීම සහ ස්වේච්ඡා පදනමින් බලාත්මක කිරීම 2020 වර්ෂයේ මැද භාගයේ දී සහ අනිවාර්ය පදනමින් බලාත්මක කිරීම 2021 වර්ෂය අවසන් වන විට සිදුකිරීමට මහජන උපයෝගීතා කොමිසම කටයුතු කරනු ඇත. |
| ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසන් සභාව | 2g බලශක්ති සේවා සම්පාදකයින් විසින් සපයන බලශක්ති සේවාවන්හි සැපයුම් සහ සේවා පිළිබඳ ගුණාත්මක ප්‍රමිති නිශ්චය කොට ස්වේච්ඡා පදනමින් 2020 වර්ෂය අවසන් වන විට අනිවාර්ය පදනමින් 2021 වර්ෂය වන විට බලාත්මක කිරීමට මහජන උපයෝගීතා කොමිසම කටයුතු කරනු ඇත. |

| | | |
|---|---|---|
| 2h | 2025 වසර වන විට නාගරික ප්‍රදේශවලින් බැහැර සියලුම විදුලි බෙදා හැරීම් පද්ධති ඉදිකිරීම් පරිවෘත පොකුරු රැහැන් බවට පත් කරනු ඇත. නාගරික ප්‍රදේශවල විදුලි බෙදා හැරීම් පද්ධති 2030 වසර වන විට භූගත පද්ධති බවට පත් කරනු ඇත. අලුතින් ඉදිවන සියලු අඩු වෝල්ටීයතා පද්ධති පරිවෘත පොකුරු රැහැන් යොදා ඉදි කරනු ඇත. | ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පුද්ගලික) සමාගම |
| 2i | 2019 වසර තුළදී ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පෞද්ගලික) සමාගම විසින් සිය සමස්ත දාමය ආවරණය කරමින් තාක්‍ෂණ විගණනයක් සිදු කරනු ඇති අතර, ප්‍රධාන උපකරණවල පිරිවිතර, තත්ත්වය සහ ප්‍රමිතිය වාර්තා කර ප්‍රමිතිකරණ වැඩසටහනක් 2020 වසර තුළදියත් කරනු ඇත. | ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පුද්ගලික) සමාගම |
| 2j | කේන්ද්‍රගතව ඇති ගෘහස්ත සහ කාර්මික පාරිභෝගික සමූහ වෙත පවත්නා නල මාර්ග මගින් හෝ නව නල මාර්ග මගින් වායු සහ ද්‍රව ඉන්ධන සැපයීමේ ශක්‍යතාව 2021 වසර තුළදී අධ්‍යයනය කෙරේ. | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව/ ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාංශය |
| 2k | 2020 වර්ෂය තුළදී රටට අගයක් ලබාදිය හැකි සුහුරු ජාල සහ සුහුරු මානන තාක්‍ෂණ හඳුනා ගැනීම සඳහා බෙදාහැරීමේ බලපත්‍ර හිමියන් 5 දෙනෙකු ආවරණය කරමින් නියමු ව්‍යාපෘති 5ක් ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පෞද්ගලික) සමාගම මගින් දියත් කරනු ඇත. | ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පුද්ගලික) සමාගම |
| 2l | 2020 වර්ෂය මැද භාගයේ දී ඉල්ලුම් කරන ඕනෑම පාරිභෝගිකයෙකු සඳහා සුහුරු මනු සහ පෙර-ගෙවුම් මනු ලබාදිය යුතුය. | |
| 2m | 2020 වර්ෂය මැද භාගයේ දී බිල්පත් ගෙවීම් සහ ප්‍රගතිය විමසීම් ඇතුළුව ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පෞද්ගලික) සමාගම විසින් ලබාදෙන සියළු සම්මත සේවාවන්ගෙන් අවම වශයෙන් 50%ක් හෝ වසර 2020 අවසානයේ දී සියලුම සාමාන්‍ය සේවා ජංගම දුරකථන සහ අන්තර්ජාලය ඔස්සේ ද ලබාගැනීමට පහසුකම් සලසනු ඇත. | ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පුද්ගලික) සමාගම |

**4.3 ජාතික ආර්ථිකය සඳහා ප්‍රශස්ත පිරිවැයකට බලශක්ති සැපයුම් සේවාවන් ලබාදීම** — වගකීම

ජාතික ආර්ථිකය සඳහා ප්‍රශස්ත පිරිවැයකට බලශක්ති සේවාවන් සැපයීම සඳහා හඳුනාගත් උපායමාර්ග ක්‍රියාවට නැංවීම පිණිස වගකීම් පවරා ඇති ආයතන විසින් මතු සඳහන් ඉලක්ක සහ සංධිස්ථාන සපුරාගත යුතු වේ.

| | | |
|---|---|---|
| 3a | ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් පිහිටුවා ඇති නියාමන යාන්ත්‍රණය තුළින් ලංකා විදුලිබල මණ්ඩලය, ඛනිජ තෙල් සංස්ථාව සහ ක්ෂේත්‍රයේ ආයතන විසින් විදුලිය සහ ඛනිජ ඉන්ධන නිෂ්පාදන සඳහා විනිවිදභාවයකින් යුතු අයකුම 2020 වර්ෂයේ මැද භාගය වන විට සකස් කරනු ඇත. | ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව |
| 3b | අවම මිල ගාස්තු, මසකට කිලෝවොට් පැය 30කට වඩා අඩුවෙන් භාවිතා කරන නිවෙස්වලට පමණක් සීමා කෙරේ. විශේෂ සලකා බැලීමක් අවශ්‍ය පාරිභෝගික කොටස් හඳුනා ගැනීම සහ ඔවුන් සඳහා අවශ්‍ය වන සහනාධාර ප්‍රමාණය ගණනය කිරීම අරමුණු කොට ඒ පිළිබඳ අධ්‍යයනයක් 2020 වසරේදී විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් සිදුකරනු ඇත. | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |

| | |
|---|---|
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 3c ද්‍රව හා වායු ඛනිජ ඉන්ධන ක්ෂෙත්‍ර සඳහා 2019 වර්ෂය අවසන් වන විටකෙටි හා මධ්‍ය කාලීන සැලසුම් යාන්ත්‍රණයක් සහ අනවරත සැලසුම් ක්‍රියාවලියක් ස්ථාපනය කෙරේ. මේ අනුව එහි පළමු සැලැස්ම 2020 වසර තුළදී එළි දැක්වේ. |
| වගකීම | **4.4 බලශක්ති කාර්යක්‍ෂමතාවය සහ සංරක්‍ෂණය වැඩි දියුණු කිරීම**<br>බලශක්ති පද්ධති ඵලදායී ලෙස කළමනාකරණය සහ ක්‍රියාත්මක කරමින් බලශක්තිය කාර්යක්‍ෂම ලෙස පරිභෝජනය සහ සංරක්‍ෂණය සහතික කරනු ඇත. වගකීම් පවරා ඇති ආයතන විසින් මතු සඳහන් ඉලක්ක සහ සංධිස්ථාන සාක්‍ෂාත් කරගනු ඇත. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 4a 2023 වසර වන විට විශිෂ්ට බලශක්ති භාවිතය 2015 භාවිත මට්ටමෙන් 10%කින් අඩු කිරීමේ අරමුණ ඇතිව, ජාතික බලශක්ති කාර්යක්‍ෂමතාවය වැඩි දියුණු කිරීමේ සහ සංරක්‍ෂණය කිරීමේ වැඩසටහනක් දියත් කර මධ්‍යම ජාලයෙන් ගිගාවොට් පැය 1,243 ක ඉතිරියක් සාක්‍ෂාත් කෙරේ. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 4b LED සඳහා අවම බලශක්ති කාර්යසාධන ප්‍රමිති සහ වායු සමීකරණ, පරිගණක, ශීතකරණ, සිවිලිං විදුලි පංකා, ප්‍රතිදීප්ත විදුලි පහන්/තුලබරු සහ ප්‍රේරණ මෝටර් සඳහා බලශක්ති ලේබල් 2020 වර්ෂය මැද භාගයේ දී ක්‍රියාවට නංවනු ඇත. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 4c කාර්යක්‍ෂම, දුම් සහ දැලි රහිත ජෛවස්කන්ධ උඳුන් ගෘහස්ත ක්ෂේත්‍රයේ ව්‍යාප්ත වීම 2022 වසර වන විට 10%කින් ඉහළ නංවනු ඇත. මෙවැනි උඳුන්වල භාවිතා වන සකස් කරන ලද සහ වාණිජකරණය වූ ජෛවස්කන්ධ ඉන්ධන සුලභ කෙරේ. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 4d නම් කරන ලද පාරිභෝගිකයින් සඳහා 2019 වර්ෂය අවසන් වන විට 'බලශක්ති කළමනාකරණ ක්‍රමවේද' අනිවාර්ය පදනමින් ක්‍රියාවට නංවනු ඇති අතර සෙසු ආයතනික පාරිභෝගිකයින් සඳහා මෙය 2020 වර්ෂය වන විට ව්‍යාප්ත කරනු ඇත. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 4e 2020 වසර වන විට දැනට ඉදිවී ඇති ගොඩනැගිලිවල බලශක්ති කාර්යක්‍ෂමතාව ඉහළ නැංවීම සඳහා අරඹන ව්‍යාපෘති සඳහා කාර්යක්‍ෂම උපකරණ ආනයනයේදී පැනවෙන තීරුබදු සහ වෙනත් බදු අඩුකිරීමටද, එවැනි ආයෝජන කෙටි කාලයකින් ක්‍ෂය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුන්වාදීමෙන් පවතින ගොඩනැගිලිවල කාර්යක්‍ෂමතාවය ඉහළ නැංවේ. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 4f සරල බලශක්ති භාවිතා දර්ශකයක් පදනම් කර ගනිමින් වාණිජ ගොඩනැගිලි සඳහා අසමාන බදු ක්‍රමවේදයක් 2020 වර්ෂය අවසන්වන විට හඳුන්වා දෙනු ඇත. රාජ්‍ය අංශය විසින් නායකත්වය ගන්නා හරිත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් කාර්යක්‍ෂම තාක්‍ෂණ වෙළඳපොළ දිරිගැන්වීමට ද ඒ සමාන ක්‍රමවේදයක් 2020 වර්ෂය අවසන් වන විට හඳුන්වා දෙනු ඇත. |
| ලංකා විදුලිබල මණ්ඩලය | 4g විදුලි ජනන යන්ත්‍ර කාර්යක්‍ෂමතාවයන් සහ උපකාරක පද්ධතිවල කාර්යක්‍ෂමතාවය ඇගයීම සඳහා සියලු විදුලිබලාගාර බලශක්ති විගණනයකට ලක් කරනු ඇති අතර, 2020 වර්ෂයේ දී සියලු අංශ ආවරණය වන පරිදි කාර්යක්‍ෂමතා වර්ධන වැඩසටහනක් දියත් කරනු ඇත. |
| විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 4h පොදු ස්ථාන ආලෝකකරණය ද ඇතුළුව ග්‍රාමීය, නාගරික සහ ප්‍රධාන මාර්ග ආලෝකකරණය සඳහා ආලෝකකරණ ප්‍රමිති 2020 වර්ෂය තුළ හඳුන්වා දී අනිවාර්ය පදනමින් ක්‍රියාවට නංවනු ඇත. |
| ලංකා විදුලි (පුද්ගලික) සමාගම | 4i නියමු පරිමාණයේ ස්වයංක්‍රීය ඉල්ලුම් ප්‍රතිචාර ව්‍යාපෘතියක් 2021 වර්ෂයේ මැද භාගයේ දී ක්‍රියාවට නංවනු ඇති අතර වැඩිදුර ව්‍යාප්තිය සඳහා මෙම තාක්‍ෂණයේ තාක්‍ෂණ-ආර්ථික ශක්‍යතාවය ලේඛනගත කරනු ඇත. |

| | | |
|---|---|---|
| 4j | විදුලි ජාලයෙහි සමස්ත පද්ධති හානිය 2020 වර්ෂය වන විට ශුද්ධ ජනනයෙන් 7.5% ක මට්ටමක් දක්වා අඩු කරනු ඇත. | ලංකා විදුලිබල මණ්ඩලය ලංකා විදුලි (පුද්ගලික) සමාගම |
| 4k | විදුලි පාරිභෝගිකයන්ගෙන් හටගන්නා ප්‍රතිගාමක බලශක්තිය සඳහා වූ ඉල්ලුම අධෛර්යමත් කිරීම සඳහා ප්‍රමාණය මත පාදක වූ ගාස්තුවක් 2020 වසර අවසානයට පෙර හඳුන්වා දී ප්‍රතිගාමක බලය පාලනය තීව්‍ර කෙරේ. | ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පුද්ගලික) සමාගම |
| 4l | වැළකීම, විතැන් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ක්‍රමෝපාය යොදා ගැනීම මඟින් සහ දිවයිනෙහි ප්‍රධාන නගර සඳහා නවීන බහුවිධ ප්‍රවාහන කළමනාකරණ විසඳුම් ලබාදීම මඟින් 2016 වර්ෂයේ දායකත්වය හා සැසඳීමේ දී 2023 වර්ෂයේදී පොදු ප්‍රවාහන මාධ්‍යවල දායකත්වය 10% කින් ඉහළ නැංවීමට මැදිහත් වනු ඇත. | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය |
| 4m | අතථ්‍ය හමුවීම් සඳහා සියළු රාජ්‍ය ආයතන, ප්‍රධාන කාර්යාල සහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලවලින් අවම වශයෙන් සියලුම රාජ්‍ය අයතනවලින් 30% ක් සඳහා 2021 වසර වන විට දුරස්ථ-සම්මන්ත්‍රණ පහසුකම් ලබා දෙනු ඇත. වර්ෂ 2020 වන විට රජයේ සියලු ප්‍රධාන කාර්යාලවල දුරස්ථ-සම්මන්ත්‍රණ පහසුකම් තිබිය යුතුය. රැස්වීම සඳහා භෞතිකව සහභාගී වීමට පැයකට වඩා වැඩි කාලයක් ගමන් කළ යුතු නිලධාරින්ගේ භෞතික පැමිණීම අධෛර්යමත් කළ යුතු වන අතර, 2019 වර්ෂය අවසන් වන විට සියලු අමාත්‍යාංශවල ස්ථාපනය කරනු ලබන දුරස්ථ-සම්මන්ත්‍රණ පහසුකම් භාවිතා කොට එවැනි රැස්වීම් සඳහා සම්බන්ධ විය යුතුය. | රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශය |
| 4n | 2020 වර්ෂයේ සිට ප්‍රවාහන බලශක්ති භාවිතය අඩු කිරීම සඳහා භෞතිකව පෙනී නොසිට ලබාගත හැකි රජයේ ආයතනවලින් සපයනු ලබන සියලු සාමාන්‍ය සේවාවන් අන්තර්ජාලය හෝ ජංගම දුරකථන හරහා ලබාදිය යුතුය. | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා ඩිජිටල් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය |
| 4o | වාණිජ ගොඩනැගිලි සඳහා කාර්ය සාධනය පදනම් කරගත් බලශක්ති කාර්යක්ෂමතා කාර්ය සංග්‍රහයක් 2019 වර්ෂය අවසන්වන විට අනිවාර්ය කරනු ඇති අතර, ගෘහස්ත ක්ෂේත්‍රය සඳහා ස්වේච්ඡා ක්‍රමවේදයක් 2019 වර්ෂය අවසානයේ දී හඳුන්වා දෙනු ඇත. | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය |
| 4p | බලශක්ති කළමනාකරණය පිළිබඳ අවධානයත් සුහුරු ජාල තාක්ෂණයෙන් දිවෙන ස්වයංක්‍රීය ඉල්ලුම් ප්‍රතිචාර පද්ධති සඳහා ඇති අනාගත අවකාශයත් සලකා, 2020 වර්ෂයේ සිට ගොඩනැගිලි කළමනාකරණ පද්ධති ස්ථාපනය කිරීම වාණිජ ඉදිකිරීම් සඳහා අනිවාර්ය කෙරෙනු ඇත. | බස්නාහිර හා මහනගර සංවර්ධන අමාත්‍යාංශය |

**4.5 ස්වාධීනත්වය ඉහළ නැංවීම**

| | |
|---|---|
| ආනයනය කරන ලද ඛනිජ ඉන්ධන මත යැපීම අවම කිරීම සහ බලශක්ති අංශයේ ඉහළ මට්ටමේ නම්‍යශීලිතාවයක් ළඟා කර ගැනීම සඳහා දේශීය බලශක්ති සම්පත් ප්‍රශස්ත මට්ටම් දක්වා සංවර්ධනය කරනු ඇත. වගකීම් පවරා ඇති ආයතන විසින් මතු සඳහන් ඉලක්ක සහ සංධිස්ථාන සාක්ෂාත් කර ගත යුතුවේ. | වගකීම |

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය /ඛනිජ සම්පත් සංවර්ධන ලේකම් කාර්යාංශය

5a ස්වාභාවික වායූ හෝ පුනර්ජනනීය බලශක්ති යොදා නිපදවන හයිඩ්‍රජන් වායුව සහ ද්‍රව ඉන්ධන, ප්‍රවාහන සහ අනෙකුත් ක්ෂේත්‍රවල භාවිතයට ගැනීමේ ශක්‍යතාව 2022 වර්ෂයේදී අධ්‍යයනය කෙරේ.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

5b ආර්ථිකය, තාක්‍ෂණය සහ සම්පත්වල ගුණාත්මක භාවය සැළකිල්ලට ගනිමින් සකස් කරගත් ප්‍රමුඛතා අනුපිළිවෙළකට අනුව පුනර්ජනනීය බලශක්ති සම්පත් ගවේෂණය කරනු ඇත. ජලවිදුලියට පසුව දෙවනුව වැදගත් වන පුනර්ජනනීය බලශක්ති සම්පත ලෙස සුළං බලය හඳුනාගනු ලබන අතර, 2022 වර්ෂයේදී විදුලි උත්පාදනයෙන් 20%ක දායකත්වයක් මහා පරිමාණ ජල විදුලි බලාගාර හැර අනෙකුත් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ සහයෝගීව සුළං බලය සංවර්ධනය කිරීම සඳහා පුමුඛස්ථානය ලබාදෙනු ඇත.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

5c වාණිජ දැව සහ ඉන්ධන දැව වගාවන් ලෙස සංවර්ධනය කිරීම සඳහා නිසරු ඉඩම් හෙක්ටයාර 10,000ක් ජෛවස්කන්ධ බලශක්ති සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර 2020 වර්ෂයේ සිට ඇරඹෙන පස් අවුරුදු වැඩසටහනක් යටතේ සංවර්ධකයන් සඳහා කල්බදු දෙනු ඇත.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

5d කලාප 5ක ජෛවස්කන්ධ සැපයුම්දාම වාණිජකරණය වන තෙක් ජෛවස්කන්ධ අවශේෂ රැස් කිරීම, මිශ්‍ර වගා සහ තිරසර නිස්සාරණය සහතික කිරීම පිළිබඳ තුන් අවුරුදු නියමු ව්‍යාපෘතියක් 2020 වසර වන විට ආරම්භ කෙරේ.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

5e කොළඹ සිට ගුවන්තොටුපළ, අවිස්සාවේල්ල, මීගමුව, පානදුර සහ වේයන්ගොඩ දක්වා වන වඩාත් කාර්යබහුල ප්‍රධාන දුම්රිය මාර්ග 2023 වර්ෂයේ මැද භාගය වන විට විද්‍යුතනය කරනු ඇති අතර 2025 වසර වන විට අනෙකුත් පළාත්බද නගරාශ්‍රිත කොටස් වැඩි දියුණු කොට විද්‍යුතනය කරනු ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය ලංකා විදුලි (පුද්ගලික) සමාගම/ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

5f 2022 වසර වන විට සැහැල්ලු වාහන ලියාපදිංචියෙන් අවම වශයෙන් 20%ක් විදුලි රිය බවට සහතික වනු ඇත. 2020 වසර වන විට ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පෞද්ගලික සමාගම මගින් සීඝ්‍ර ඍජු ධාරා ආරෝපණ මධ්‍යස්ථාන 25ක් උපක්‍රමික වශයෙන් වැදගත් තැන්වල ස්ථාපනය කෙරේ. මෙයට අමතර වශයෙන් මෙම මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා මූල්‍ය දිරිගැන්වීම් ලබාදී පෞද්ගලික අංශය දිරි ගැන්වීමට සුනිත්‍ය බලශක්ති අධිකාරිය කටයුතු කරනු ඇත.

**වගකීම**

**4.6 පරිසරය පිළිබඳව සැලකිලිමත් වීම**

ශ්‍රී ලාංකික බලශක්ති ක්ෂේත්‍රයේ සුළු අංගාර තීව්‍රතාව තවදුරටත් අඩු කරමින් දේශගුණික විපර්යාසය සඳහා අර්ථාන්විත ප්‍රතිචාර දක්වනු ඇත. වගකීම් පවරා ඇති ආයතන විසින් මතු සඳහන් ඉලක්ක සහ සංධිස්ථාන සාක්ෂාත් කර ගනිමින් ගෝලීය සහ දේශීය පරිසරය ආරක්ෂා කරගැනීම සඳහා බලශක්ති සේවාවල අහිතකර පාරිසරික සහ සමාජ බලපෑම් අවම කරනු ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය

6a ලංකා විදුලිබල මණ්ඩලය විසින් අංගාර තිර කිරීමේ වගාවන් භාවිතා කරමින් හරිතාගාර වායු විමෝචන පාලනය පිණිස අනාගත ගල් අඟුරු බලාගාර ඉදි කිරීම නිසා සිදුවන අංගාර භාර වර්ධනය තුලනය කිරීමට නියමිතය. යොදාගත හැකි තිර කිරීමේ වගාවන්, යොදාගත හැකි ඉඩම් සහ අදාළ මූල්‍ය විශ්ලේෂණ ද සඳහන් කරමින් මේ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් 2020 වර්ෂයේදී සිදු කිරීමට නියමිතය.

| | |
|---|---|
| 6b බලශක්ති ක්ෂේත්‍රයෙන් සිදුවන වායු විමෝචන කළමනාකරණය සහ අවම කිරීම සඳහා 2020 වර්ෂය වන විට බලශක්ති පද්ධතිවල වායු විමෝචන අඛණ්ඩව නිරීක්ෂණය කර තත්කාලීනව ප්‍රකාශ කරනු ඇත. | පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය |
| 6c වාෂ්පීකරණය සඳහා ඉහළ විභවයක් පවතින සැහැල්ලු ඉන්ධන සඳහා සංවෘත ගබඩාකරණ සහ බෙදාහැරීමේ පද්ධති 2020 වර්ෂයේ සිට ක්‍රමානුකූලව හඳුන්වා දෙනු ඇත. | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව/ලංකා ඉන්දියානු තෙල් සමාගම |
| 6d බලශක්ති ක්ෂේත්‍රයේ ආයතන සඳහා සෞඛ්‍ය, ආරක්ෂණ සහ පාරිසරික ප්‍රමිතීන් 2020 වසරේදී හඳුන්වා දී 2022 වසර වන විට පරිපූර්ණ වශයෙන් ක්‍රියාත්මක කෙරේ. | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය/ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය |

**4.7 පුනර්ජනනීය බලශක්තියෙහි දායකත්වය ඉහළ නැංවීම**

වගකීම

ඉලක්ක සහ සංධිස්ථාන සාක්ෂාත් කර ගනිමින් දිවයිනෙහි බලශක්ති මිශ්‍රණයෙහි පුනර්ජනනීය බලශක්ති දායකත්වය වර්ධනය කරනු ඇත. වගකීම් පවරා ඇති ආයතන විසින් මතු සඳහන් ඉලක්ක සහ සංධිස්ථාන සාක්ෂාත් කර ගත යුතුවේ.

| | |
|---|---|
| 7a පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමැතිය සහ ඒ සඳහා අවශ්‍ය ඉඩම් අත්කර ගැනීම සම්බන්ධීකරණය සඳහා අනුමැතිය ලබාදෙන රාජ්‍යායතන සහ ඉඩම් සම්පත් පිළිබඳ කළමනාකරණය සිදු කරන ආයතනවලට අදාළ ජ්‍යෙෂ්ඨ අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් සමන්විත උපදේශක කමිටුවක් 2019 වර්ෂය අවසන් වන විට පත් කෙරේ. | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය |
| 7b විදුලිබල ජාලය සම්බන්ධ ගැටළු, බලාගාර ක්‍රියාකරවීමේ විකල්ප සහ විවිධ පුනර්ජනනීය බලශක්ති සම්පත්වල ස්වභාවයන් ද ගැඹුරින් විශ්ලේෂණය කොට පුනර්ජනනීය බලශක්ති විදුලි බලාගාර ජාලගත කිරීම පිළිබඳ සැලැස්මක් 2020 වසර තුළදී එළි දක්වා අනවරත සැලසුම් ක්‍රියාවලියක් හරහා එය වරින් වර ප්‍රකාශයට පත් කෙරෙනු ඇත. | ලංකා විදුලිබල මණ්ඩලය |
| 7c සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ආරම්භ කරන පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන වැඩසටහනක් හරහා ආයෝජනයට සුදුසු මට්ටමකට සංවර්ධනය කරන ලද නව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සමූහයක් 2020 වර්ෂය මැද භාගයේ දී තරඟකාරී මිළ ගණන් කැඳවීමකට සූදානම් කෙරේ. මේ හරහා 2023 වසර වන විට මෙගාවොට් 1,600ක ධාරිතාවයකින් විදුලි ජනනයෙන් 20% ක් සම්පාදනය කෙරෙනු ඇත. | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය |
| 7d සම්මත මිළ ක්‍රමවේදය සක්‍රියව පැවති අවදියේ සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ඉදිරිපත් වූ, එනමුත් එම ක්‍රමවේදය නතර වූ බැවින් ප්‍රගතියක් නොලද දැනට අනුමැති ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල ඇති අයදුම්පත් සුදුසු අන්තර්කාලීන වැඩපිළිවෙලක් මගින් තරඟකාරී ක්‍රමවේදයට යොමුකෙරේ.මෙහිදී අදාළ ව්‍යාපෘති යෝජකයන් හට විශේෂ සැලකිල්ලක් ලබාදීම සඳහා ව්‍යාපෘතියේ ප්‍රගතිය, මේ වනවිට සිදුකර ඇති ආයෝජනය වැනි කරුණු පදනම් කොට ගැනේ. ඒ ඒ තාක්ෂණයන්ගේ සුවිශේෂී ලක්ෂණ ද සලකා බලා මෙසේ ප්‍රගතියක් ලබා නොගත් ව්‍යාපෘති කඩිනම් සංවර්ධනය සඳහා විකල්ප වැඩසටහන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2020 වර්ෂය මැද භාගයේ දී නිර්මාණය කෙරේ. මෙමගින් මේ ආකාරයේ නතර වූ ව්‍යාපෘති 2023වසර වනවිට තරඟකාරී ක්‍රමවේද යටතේ සංවර්ධනය කොට අවසන් කෙරේ. | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය/ලංකා විදුලිබල මණ්ඩලය |
| 7e අදාළ රාජ්‍යායතන සමඟ සහයෝගීත්වයෙන් ජලය, සූර්ය සහ සුළං බලශක්තිය සඳහා දියුණු පුරෝකථන පද්ධති ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2020 වර්ෂය අවසන් වන විට පිහිටුවනු ඇත. | ලංකා විදුලිබල මණ්ඩලය |

| | |
|---|---|
| | 7f පරිසර හිතකාමී ප්‍රවණතා දක්වන විදුලි පාරිභෝගික කොටස් සඳහා විශේෂිත හරිත අයක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ. මේ හරහා ජනනය වන අතිරේක අරමුදල්වලින් කොටසක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලට බැර කොට පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයට යෙදවේ. ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පුද්ගලික) සමාගම |
| වගකීම | **4.8 බලශක්ති ක්ෂේත්‍රයේ යහපාලනය ශක්තිමත් කිරීම** <br> වගකීම් පවරා ඇති ආයතන විසින් මතු සඳහන් ඉලක්ක සහ සංධිස්ථාන සාක්ෂාත් කර ගැනීමෙන් බලශක්ති ක්ෂේත්‍රයේ යහපාලනය සහතික කිරීම සඳහා ස්ථාවර ප්‍රතිපත්ති වාතාවරණයක් ස්ථාපිත කරනු ඇති අතර, නියාමන රාමු තවදුරටත් ශක්තිමත් කරනු ඇත. |
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 8a ඛනිජ ඉන්ධන සංවර්ධනය විෂයභාර අමාත්‍යාංශය විසින් ඛනිජ ඉන්ධන නිස්සාරණය සංවර්ධනය කිරීම සඳහා එම කටයුතු නියාමනය කිරීමේ නීති සහ අණපනත් 2020 වසර මැද භාගයේ සම්මත කර ගැනීමට කටයුතු කෙරේ. |
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 8b ඛනිජ ඉන්ධන සැපයීමේ සහ බෙදාහැරීමේ අංශ නියාමනය සඳහා අවශ්‍ය නීතිරාමු සකසා ස්වාධීන නියාමන ආයතනයක් වෙත 2020 වසර අවසානයේ දීඒ සඳහා බලය පැවරේ. |
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 8c 2009 විදුලිබල පනතට අනුකූලව ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යානුකූල ඒකක 2020 වසරේ සිට ස්වාධීන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කෙරේ. |
| ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පුද්ගලික) සමාගම | 8d විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රධාන වත්කම් ප්‍රශස්ත භාවිතයේ සිට පාරිභෝගික සබඳතා කළමනාකරණය දක්වා වූ අගය දාමයේ සියලු අංශ ආවරණය කරමින් විදුලි ක්ෂේත්‍රය පරිගණකගත කෙරේ. මෙම වැඩසටහන 2020 වසරේ අරඹා අදියර කිහිපයකින් 2022 වසරේදී සම්පූර්ණ කෙරේ. |
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය/ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 8e දත්ත සුරැකීම, ඒවායේ ප්‍රමිතිය සහ රහසිගතභාවය සාක්‍ෂාත් කරගැනීම පිණිස බලශක්ති ක්ෂේත්‍රයේ පරිගණක දත්ත කළමනාකරණය සඳහා දත්ත පාලන ප්‍රතිපත්තියක් 2020 වර්ෂය මැද භාගයේ දී හඳුන්වා දෙනු ලැබේ. |
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 8f බලශක්ති ක්ෂේත්‍රයේ ගනුදෙනු හා සිදුවීම් වාර්තාකරණය සඳහා වූ නිලධාරීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම 2019 වසර අවසානයේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නායකත්වය යටතේ ස්ථාපනය කෙරේ. 2019 වසරේ ප්‍රකාශනය සමග යම් වසරක බලශක්ති තුලනය ඊළඟ වසරේ ප්‍රථම මාස හය තුළ ප්‍රකාශයට පත් කෙරේ. |
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය/ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 8g තරඟකාරී පදනම මත ආයෝජකයන්ට සහ සංවර්ධන හවුල්කරුවන්ට පහසුවෙන් සහභාගී වීම සඳහා බලශක්ති ක්ෂේත්‍රයේ සියලු ව්‍යාපෘති සහ ආයෝජන අවස්ථාවන් හඳුනාගෙන යම් සුදුසු ව්‍යාපෘති සංකල්ප ආකෘතියක ලේඛනගත කර එක් එක් ආයතන විසින් 2020 වර්ෂයේ සිට ප්‍රකාශයට පත් කරනු ඇත. |
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය/ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 8h බලශක්ති ක්ෂේත්‍රයේ ආයතන සඳහා රේඛීය අමාත්‍යාංශ විසින් සමගාමී ප්‍රධාන කාර්යසාධන දර්ශක (Key Perforamance Indicators -KPI) 2019 අග භාගයේ දී හඳුන්වා දී අනවරතව අධීක්‍ෂණය කොට 2020 වසරේ සිට ප්‍රකාශයට පත් කෙරේ. |

| | | |
|---|---|---|
| 8i | 2020 වර්ෂයේ මැද භාගයේ දී පොදු-පෞද්ගලික හවුල් ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත බලශක්ති යටිතල පහසුකම් පිළිබඳ නිරවුල් මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කෙරේ. | ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය/ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය |
| 8j | 2020 වර්ෂය අවසානයේ විදුලිය සඳහා සක්‍රිය තොග වෙළඳපොලක් නිර්මාණය කිරීමට අවශ්‍ය තත්ත්වයන් සහ එමගින් අත්විය හැකි ප්‍රතිලාභ හඳුනාගැනීම සහ සම්ප්‍රේෂණ බෙදාහැරීම් පද්ධති හරහා විදුලිය රැගෙන යාමට අවසර ලබාදීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කෙරේ. | ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය/ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය |
| 8k | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් දැනටමත් ස්ථාපනය කොට ඇති අන්තර්ජාලගත බලශක්ති දත්ත ගබඩාව පාදක කොට ගනිමින් බලශක්ති පාරිභෝගිකයන්ගේ දැනුම වර්ධනයට, බලශක්ති විකල්ප හඳුන්වා දීමට, මිල ප්‍රවණතා සැපයීමට සහ කාර්යක්ෂමතා වර්ධනය සඳහා සුදුසු ජංගම දුරකථන යෙදවුමක් 2020 වසර තුළදී හඳුන්වා දෙනු ලැබේ. | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය |
| **4.9** | **අනාගත බලශක්ති යටිතල ව්‍යුහය සඳහා ඉඩම් සුරක්ෂිත කිරීම**<br>වගකීම් පවරා ඇති ආයතන විසින් මතු සඳහන් ඉලක්ක සහ සංධිස්ථාන සාක්ෂාත් කර ගැනීමෙන් එවැනි පහසුකම් නියමිත කාලවලදී ක්‍රියාත්මක කිරීම සඳහා සහ අහිතකර සමාජ බලපෑම් අවම කිරීම සඳහා අනාගත බලශක්ති යටිතල ව්‍යුහ ස්ථාපිත කිරීමේ උපාය මාර්ගික ස්ථාන කල් ඇතිව සලකුණු කර සුරක්ෂිත කරනු ඇත. | වගකීම |
| 9a | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ උපදේශකත්වයෙන් මෙම කාරණය සඳහා පත් කරනු ලබන ඒකාබද්ධ කමිටුවක් මගින් ගල් අඟුරු, ස්වාභාවික වායු සහ න්‍යෂ්ටික බලාගාර, පිරිපහදු සහ පර්යන්ත වැනි අනාගත බලශක්ති යටිතල ව්‍යුහ ස්ථාපිත කිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනා ගනිමින් උපායමාර්ගික පහසුකම් සැලසුම් සිතියමක් 2020 වර්ෂය වන විට සකස් කරනු ඇත. | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |
| 9b | 2020 වසරේ සිට 2025 වසර දක්වා සංවර්ධන කාල පරාසයක් සමඟින් සුළං සහ සූර්ය උද්‍යාන වැනි මහා පරිමාණ පුනර්ජනනීය යටිතල ව්‍යුහ ස්ථාපිත කිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනාගනිමින් ප්‍රධාන සැලැස්මක් 2019වර්ෂය අවසන් වන විට සකස් කර ප්‍රකාශයට පත් කරනු ඇත. | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය |
| 9c | වර්ෂ 2020-2030 කාල පරාසය තුළ සංවර්ධනය කෙරෙන ස්වාභාවික වායු නල මාර්ග, ඛනිජ තෙල් නල මගින් ප්‍රවාහනය සහ ප්‍රධාන විදුලි සම්ප්‍රේෂණ මාර්ග හඳුනාගෙන ඒකාබද්ධ කමිටුවක් විසින් 2020 වර්ෂය අග දී සිතියමක් ලෙස ප්‍රකාශයට පත් කරනු ඇත. | ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව |
| 9d | මේ වන විටත් විවිධ ආයතන සතුව ඇතිGIS මූලිකාංග පදනම් කරගනිමින්, විදුලිය, ජලය, සන්නිවේදන සහ ඛනිජතෙල් ඇතුළුව දැනට පිහිටුවා ඇති සහ අනාගත යටිතල ව්‍යුහ විදහා දක්වමින් ජාතික GIS දත්ත ගබඩාවක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2020 වර්ෂය වන විට සකස් කරනු ඇත. | ලංකා විදුලිබල මණ්ඩලය |

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

9e පොදු සේවා සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් මාර්ග පිළිබඳ ගැටළු විසඳීම සඳහා අන්තර් ආයතන සම්බන්ධීකරණ අධිකාරියක් 2020 වසර වන විට පිහිටුවනු ඇත.

වගකීම

**4.10 නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය සඳහා අවස්ථා ලබාදීම**

ක්ෂේත්‍රයේ විශාලත්වය සලකා බලා එහි ඵලදායීතාවට දායක විය හැකි පර්යේෂණ හා සංවර්ධන සහ දේශීය අගය එක්කිරීම සඳහා එහි පවතින අවස්ථාවන් ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් සහ ව්‍යවසායකයන්ට ක්‍රියාකාරීව සහභාගී විය හැකි පරිදි විවෘත කරනු ඇත. වගකීම් පවරා ඇති ආයතන විසින් මතු සඳහන් ඉලක්ක සහ සංධිස්ථාන සාක්ෂාත් කර ගත යුතුවේ.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

10a බලශක්ති ක්ෂේත්‍ර යටිතල ව්‍යුහ සංවර්ධනයේ නිරතව සිටින ශ්‍රී ලාංකික ව්‍යවසායයන් සහ ශ්‍රී ලාංකික සමාගම් විසින් නායකත්වය දෙන ඒකාබද්ධ ව්‍යාපාර උනන්දු කරවීම සඳහා 25%ක පිරිවැය ප්‍රතිලාභයක් 2019 වර්ෂය වන විට ප්‍රදානය කරනු ඇත.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

10b 2020 වර්ෂය මැද භාගයේ දී තුළදී කර්මාන්ත සහ අධ්‍යාපනික අංශ සන්ධානගත කරමින් සියළු පර්යේෂණ සහ සංවර්ධන සංවිධාන සහභාගි කරමින් සම්බන්ධීකරණය වූ පර්යේෂණ සහ සංවර්ධන ජාලයක් සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් පිහිටුවනු ඇත.වාණිජකරණය වන තෙක් රැස්කර බුද්ධිමය දේපළ ආරක්ෂා කර ගනිමින් දේශීයව සංවර්ධනය කරන ලද පුනර්ජනනීය බලශක්ති පරිවර්තන තාක්ෂණ පිළිබඳ නියමු ව්‍යාපෘති 10ක් සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ තාක්ෂණ 10ක් 2021 වර්ෂය මැද භාගයේ දී සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් හඳුන්වා දෙනු ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පුද්ගලික) සමාගම

10c 2020 වර්ෂය අවසන් වන විට ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පෞද්ගලික) සමාගම විසින් නව සහ වර්තමාන පාරිභෝගිකයන්ට වඩාත් කාර්යක්ෂම ආකාරයකින් විදුලිය භාවිතා කිරීමට අවකාශය සැළසීමට සහ විදුලිබල ජාල මැනීම, පාලනය සහ කළමනාකරණයෙහි උසස් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් භාවිතා කරමින් මනා විනිවිදභාවයක් සහිතව විසිරුණු නව පුනර්ජනනීය බලශක්ති උත්පාදන යන්ත්‍ර යෙදවීමට අවකාශ සැලසීම සඳහා උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම් වත්කම්වල විශිෂ්ට කළමනාකරණ ශක්‍යතාවයන් ප්‍රදර්ශනය කිරීම පිණිස නියමු ව්‍යාපෘති 5ක සුහුරු ජාල යොදවනු ඇත.

10d 2021 වර්ෂය අවසානය වන විට ලංකා විදුලිබල මණ්ඩලය/ලංකා විදුලි (පෞද්ගලික) සමාගම විසින් ස්වයංක්‍රීය ඉල්ලුම් ප්‍රතිචාර නියමු ව්‍යාපෘතියක් ක්‍රියාවට නංවනු ඇති අතර අනාගත උත්පාදන විකල්පයක් ලෙස එහි ආර්ථික ඵලදායීතාව වටහා ගැනීම සඳහා එහි බලපෑම් ලේඛනගත කරනු ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය ලංකා විදුලි (පුද්ගලික) සමාගම

10e දියුණු වී ඇති පරිගණක තාක්ෂණය යොදා බලශක්ති සේවා සම්පාදනයේ දී රැස්වන දත්ත සකසා දැනුම් මෙවලමක් සේ භාවිතා කෙරේ.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

10f 2020 වසර වන විට ක්ෂේත්‍රයේ සේවයේ නියුතු වෘත්තිකයින්ගේ ස්වතන්ත්‍ර වෑයම් දිරිගැන්වීම සඳහා සහ බලශක්ති ක්ෂේත්‍රය තුළ දැනුම් සම්පත් රැස් කිරීම සඳහා ලබාදෙන දායකත්වය පදනම් කරගත් දායකත්ව පාදක දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දීමෙන් බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා අවශ්‍ය දේශීය දැනුම සහ හැකියා පෝෂණය කරනු ඇත.

## පදමාලාව

**උපදේශක කමිටුව**
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙත යම් විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධව උපදෙස් ලබාදීම සඳහා පත්කරනු ලබන විශේෂඥ කමිටුවක්

**විදුලි ඉල්ලුම පාලනය සම්බන්ධ ස්වයංක්‍රිය ප්‍රතිචාර**
විදුලි සැපයුම සඳහා වන සමස්ත පිරිවැය අඩුකරගැනීම සඳහා විදුලි සැපයුම් තත්ත්වයන්ට අනුරූපිව විදුලි පාරිභෝගිකයන්ගේ ඉල්ලුම වෙනස් කිරීම සඳහා ක්‍රියාත්මක වන ස්වයංක්‍රීය පාලන පද්ධති

**ගොඩනැගිලි කළමනාකරණ පද්ධති**
බලශක්ති භාවිතයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සහ ඉල්ලුම් කළමනාකරණය කිරීමේ අරමුණින් ගොඩනැගිලිවල බලශක්ති පරිවර්තන උපකරණ පාලනය කිරීමේ පද්ධති

**අංගාර තුලනය**
මානව ක්‍රියාකාරකම් හේතුවෙන් වායුගෝලයට එකතුවන කාබන්ඩයොක්සයිඩ් විමෝචන සහ වායුගෝලයෙන් අවශෝෂණය කරගන්නා කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයේ ඇතිවන තුල්‍යතාවය

**අංගාර තිර කිරීම**
වායුගෝලයේ ඇති කාබන්ඩයොක්සයිඩ් ප්‍රභාසංස්ලේෂණය හරහා ශාක මගින් අවශෝෂණය කර ගෙන දිගු කාල සීමාවක් සඳහා ඝන තත්ත්වයෙන් පවත්වා ගන්නා ස්වාභාවික ක්‍රියාවලිය

**ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය**
විදුලි පද්ධතියක විදුලි ඉල්ලුම කළමනාකරණය කිරීම පිණිස විදුලි පාරිභෝගික අන්තයේ සිදුකරන මැදිහත්වීම්

**බලාගාර ජනනයට යෙදවීම**
විදුලි පද්ධතිවල ඇතිවන ඉල්ලුමට අනුව විදුලි ජාලයට සම්බන්ධ ජනක යන්ත්‍රවල විදුලි ජනනය පාලනය කිරීම. විදුලි පද්ධති පාලකයින් විසින් මෙම පාලනය කිරීමේ ක්‍රියාවලිය ජනක යන්ත්‍ර බලාගාර ජනනයට යෙදවීම ලෙස ද හඳුන්වනු ලැබේ. පාලනය කිරීම යම් උපදෙසක් මගින් සිදුකරන්නේ නම් එය බලාගාර ජනනයට යෙදවීම් උපදෙස් ලෙස හැඳින්වේ.

**ජනනයට යෙදවිය හැකි**
පද්ධති පාලකයින්ට අවශ්‍ය පරිදි බලගැන්වීමට, ක්‍රියාවිරහිත කිරීමට සහ විදුලි ජනනය අවශ්‍ය පරිදි පාලනය කිරීමට හැකි විදුලි ජනක යන්ත්‍ර මෙලෙස හඳුන්වනු ලැබේ.

**බෙදාහැරීම් පද්ධති**
විදුලි පාරිභෝගිකයන් ජාතික විදුලි පද්ධතියට සම්බන්ධ කරනු ලබන කිලෝවෝල්ට් 33ට වඩා අඩු වෝල්ටීයතාවය සහිත විදුලි පද්ධති

**පාරිභෝගික අන්තය/බෙදාහැරීම් පද්ධති/අංශය**
ඛනිජතෙල් සැපයුම් දාමයේ පිරිපහදු කරන ලද නිෂ්පාදන පාරිභෝගිකයන් වෙත ලබාදෙන කොටස

**විදුලියනය**
ජනතාවට විදුලිය බෙදාහැරීමේ පද්ධතිය වෙත සම්බන්ධ වීමට අවස්ථාව සලසාදීම. ශ්‍රී ලංකාව රටෙහි සියලු ජනතාවට මධ්‍යම ජාලයෙන් විදුලිය ලබා දී ඇති අතර එයින් 99.5% ක් සඳහා විදුලි සම්බන්ධතාවය ලබා දී ඇත.

**බලශක්ති වාහකය**
විවිධ ආකාරයෙන් පවතින බලශක්තිය ප්‍රයෝජනවත් ස්වරූපයකට පරිවර්තනය කොට සේවාවක් සඳහා අවශ්‍ය විට යොමුකර ගත හැකි හෝ ගබඩා කරගත හැකි ලෙස පවතින ද්‍රව්‍යයක් හෝ ප්‍රපංචයක්

**බලශක්ති අර්බුදය**
පාරිභෝගිකයන්ගේ බලශක්ති අවශ්‍යතා ඉටුකිරීමට ශක්ති පරිවර්තන පද්ධතිවල ධාරිතාව, සැපයුම් ප්‍රමාණය හෝ ඒ සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් ප්‍රමාණවත් නොවීම

**ආර්ථිකයේ බලශක්ති තීව්‍රතාවය**
රටේ ආර්ථික ක්‍රියාවලියේ අගය එකතු කිරීම එක් ඒකකයකින් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය බලශක්ති ප්‍රමාණය

**බලශක්ති සේවාව**
යම්කිසි කාර්යයක්, සේවාවක් හෝ භෞතික තත්ත්වයක් ළඟාකර ගැනීම සඳහා උපයෝගී කර ගැනෙන හෝ ඒ සඳහා සහයෝගය ලබා දෙන බලශක්තියෙහි ඕනෑම ස්වරූපයක් මගින් සිදුකෙරෙන ක්‍රියා

**බලශක්ති සංක්‍රාන්තිය**
පරිමිත බලශක්ති සම්පත් මත රඳා පැවැත්ම අඩු වෙමින් පුනර්ජනනීය බලශක්ති සම්පත් භාවිතයට යොමු වීමට උත්සාහ දැරීමේ ප්‍රවණතාව

**ස්ථාවර (විදුලි ජනන) ධාරිතාව**
විදුලි පද්ධති පාලකයින්ට අවශ්‍ය ආකාරයෙන් පද්ධතියට විදුලිය ලබාදීම තහවුරු කෙරෙන විදුලි ජනන ධාරිතාවය. කුඩා ජල විදුලි බලාගාර, සූර්ය විදුලි බලය සහ සුළං විදුලි බලය යන බලශක්ති මූලාශ්‍ර මගින් විදුලිය ලබා දීමේදී එක් එක් අවස්ථාවල ලබා ගත හැකි විදුලි ප්‍රමාණය එම බලශක්ති සම්පත් පවතින ප්‍රමාණයන් මත රඳා පවතින නිසා එම මූලාශ්‍ර මේ ගණයට අයත් නොවේ. අවම වශයෙන් පැය කිහිපයකින්වත් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ලබාදෙමින් සැලකිය යුතු මට්ටමකින් ජලය රඳවා ගැනීමේ හැකියාවක් සහිත කුඩා පරිමාණ ජල විදුලි බලාගාර මගින් විදුලි ජනනය කරන කාල සීමාවන් පද්ධති ක්‍රියාකරුවන්ට සැලසුම් කළහැකි වන නිසා එම බලාගාර මේ ගණයට අයත් වේ

**පාවෙන අළු**
දහන ක්‍රියාවලියෙන් නිදහස් වන, බොහෝ විට වායු විමෝචන පාලන පද්ධතියක් මගින් රඳවා ගනු ලබන සැහැල්ලු අළු

**ඛනිජ ඉන්ධන**
මානව කාල පරාසයක් තුළ චක්‍රීය ලෙස නැවත හට නොගන්නා බලශක්ති සම්පත්

**හරිත බලශක්ති සහතික කිරීම**
යම් නිශ්චිත කාර්යක්ෂමතාවයක් හෝ තිරසර නිර්ණායකයන්ට අනුරූප ගොඩනැගිලි හෝ බලශක්ති පරිවර්තන පද්ධති සඳහා ලබාදෙන සහතික

**හරිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය**
බලශක්ති සහ අනෙකුත් සම්පත් තිරසර ලෙස භාවිතා කිරීම කෙරෙහි දක්වන දායකත්වය ඇගයීමට ලක්වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය

**හරිත අයක්‍රමය**
බලශක්ති භාවිතයේදී නැවත වෙනස් කළ නොහැකි සාමාජීය හා පාරිසරික බලපෑම් අවම, නවීන බලශක්ති තාක්ෂණ සඳහා අමතර පිරිවැයක් ඇතුළත් විදුලි අය ක්‍රමය

**ජල විදුලි බලාගාර පෝෂක ප්‍රදේශ**
විදුලි බලාගාර එකක් හෝ කිහිපයක් සඳහා අවශ්‍ය වන ජලය ජලාශයකට හෝ ගංගාවකට සැපයෙන ලෙස වැසි ජලය පතනය වන භූමි ප්‍රදේශය

**දේශීය බලශක්තිය**
ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය හෝ එහි විශේෂිත ආර්ථික කලාපයක් තුළ හටගන්නා පුනර්ජනනීය සහ පුනර්ජනනීය නොවන බලශක්ති සම්පත්

**ස්ථාපිත විදුලි ජනන ධාරිතාව**
විදුලි බලාගාරයක විදුලි ජනන ධාරිතාවය ලෙස උරගා බලා ප්‍රකාශ කොට ඇති ධාරිතාව

**විචලනය**
සමහර බලශක්ති මූලාශ්‍රවලට ආවේණික වෙනස්වන ස්වභාවය, බොහෝ විට මෙය කුඩා කාලසීමා තුළ ක්ෂණිකව සිදුවන වෙනස්කම් පිළිබඳ කරුණකි

**ද්‍රවීකෘත ස්වාභාවික වායුව**
සාමාන්‍යයෙන් සෙන්ටිග්‍රේඩ් අංශක සෘණ 160 දක්වා සිසිල් කර පරිවාරක භාජනවල ගබඩා කරනු ලබන
ස්වාභාවික වායුව

**විදුලි ඉල්ලුම් වක්‍රය**
යම් විදුලි පාරිභෝගිකයකු ප්‍රදේශයක් හෝ රටක් මගින් විදුලිය භාවිතය කාලය සමග වෙනස් වන අයුරු දැක්වෙන ප්‍රස්ථාරය

**දේශීය මනාපය**
ලංසුවක් තුළ අන්තර්ජාතික ලංසුකරුවකුට සාපේක්ෂව දේශීය ලංසුකරුවෙකුට වාසි සැලසෙන ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස

**අඩු අංගාර තීව්‍රතාවය**
යම්කිසි බලශක්ති සේවාවක් ලබාගැනීම සඳහා අඩු ප්‍රමාණයෙන් ඛනිජ ඉන්ධන භාවිතා කිරීම

**බෙදාහැරීම් පද්ධති (අඩු සැර/අඩු වෝල්ටීයතා)**
වෝල්ටීයතාවය වෝල්ට් 400 (තෙකලා) විදුලිය හෝ වෝල්ට් 230 (එකලා) වූ විදුලි බෙදාහැරීමේ පද්ධති

**දිගු කාලීන විදුලි ජනන සැලැස්ම**
ලංකා විදුලිබල මණ්ඩලය මගින් සම්පාදනය කර ප්‍රකාශයට පත්කරනු ලබන අනාගත භාවිතය සඳහා යොදා ගත යුතු විදුලි බලාගාරවල විස්තර ඇතුළත් දිගුකාලීන සැලැස්ම

**ස්වාභාවික වායුව**
තෙල් නිධි හෝ වායු නිධි භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන බොහෝ දුරට මීතේන් වලින් සැදුම්ලත් වායුව

**ජාලයේ ශක්ති හානි**
ජාතික විදුලිබල පද්ධතිය හරහා විදුලිය ලබා දීමේදී සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් අංශවලදී සිදුවන බලශක්ති හානිය

**ජාලයෙන් බැහැර**
ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ නොවී විදුලිය භාවිතා කරන පාරිභෝගියින් සහ ඔවුන්ට විදුලිය ලබාදෙන විදුලි ජනන පද්ධති

**ජාලගත**
ජාතික විදුලිබල පද්ධතියට විදුලිය ලබාදෙන විදුලි ජනන පද්ධති සහ එම පද්ධතියට සම්බන්ධ විදුලි පාරිභෝගිකයින්

**විදුලි වෙළඳපොල**
විදුලි ජනන යන්ත්‍ර හිමියන් ඉදිරි කාලය සඳහා සැපයිය හැකි විදුලි ධාරිතාවයන් පෙන්නුම් කර ඒ සඳහා විදුලිය මිලදී ගන්නන්ට (බොහෝවිට විදුලිය බෙදාදීමේ සමාගම් හෝ විදුලි පාරිභෝගිකයින්) විදුලිය මිලදී ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කර විදුලි මිලදී ගත හැකි වෙළඳපොල

**ප්‍රාථමික බලශක්තිය**
ස්වාභාවික ස්වරූපයෙන් පවත්නා බලශක්තිය. පුනර්ජනනීය සහ පුනර්ජනනීය නොවන බලශක්ති දෙවර්ගයම මෙයට අයත් වේ.

**ප්‍රත්‍යක්ෂ උත්පාදන**
මහා පරිමාණ වාණිජ භාවිත මට්ටමට සංවර්ධනය වී ඇති විදුලි ජනන තාක්ෂණයන්

**පුනර්ජනනීය බලශක්තිය**
මානව කාල පරාසයක් තුළ චක්‍රීය ලෙස නැවත හට ගන්නා බලශක්ති සම්පත්

**ද්විතියික බලශක්තිය**
යම් බලශක්ති පරිවර්තන ක්‍රියාවලියකට භාජනය වීම නිසා ස්වාභාවික ආකාරයට වඩා වෙනත් අකාරයකින් ඇති බලශක්තිය

**සුහුරු ජාල**
විදුලි ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම සම්බන්ධ පද්ධති හොඳින් කළමනාකරණය කිරීම සඳහා ජාලය තුළ ඇතිවන විදුලි ඉල්ලීම්වල වෙනස්වීම්වලට අනුව පද්ධතිය මගින් ඉක්මණින් ප්‍රතිචාර ලබාදීම සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමවේද සහ විදුලි පද්ධති පාලනය සම්බන්ධ නව තාක්ෂණය යොදාගැනීම සහ ඒ සඳහා ජාතික විදුලි පද්ධතියට සම්බන්ධ විදුලි පාරිභෝගිකයන්ට වඩා කාර්යක්ෂම ලෙස විදුලි පරිභෝජනය සිදුකිරීමට අවස්ථාව ලබා දීමත් එමෙන්ම නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර ජනනය කෙරෙන විදුලිය වඩා ගැඹුරින්ද, හොඳ ව්‍යාප්තියකින් යුතුවද පද්ධතියකට ලබා ගැනීමත් හරහා දිගුකාලීන වශයෙන් සමස්ත විදුලි වියදම අඩුකිරීමත් විදුලි ජනනය හරහා සිදුවන පාරිසරික ගැටලු අඩුකිරීමත් පිණිස යෙදවෙන තාක්ෂණ සමූහය

**බාහිර සමාජ සහ පාරිසරික සාධක**
කවර හෝ ආර්ථික හෝ වාණිජ ක්‍රියාවලියකින් ඇතිවන සමාජ/ආර්ථික බලපෑම් සහ ඒවායින් හටගන්නා වියදම්

**සමාජ වෙළඳපොල ආර්ථිකය**
ධනවාදී ආර්ථික ක්‍රමයක පවතින නිදහස් වෙළඳපොළ හා සමාගමීව සමාජවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින් සාධාරණ තරගකාරීත්වය මෙන්ම විශේෂ අවධානය ලැබිය යුතු සමාජ කොටස් වෙනුවෙන් විශේෂිත සැලකීමක් ද දැක්විය හැකි සමාජ ආර්ථික ක්‍රමයක්

**විදුලි අයක්‍රම හරහා සමාජගත කිරීම/ප්‍රතිපූරණය**
යම් පාරිභෝගිකයෙකුට විදුලි සැපයීමේදී සිදුවන, එහෙත් එම පාරිභෝගිකයාගෙන් සෘජුව අය නොකොට සියලු පාරිභෝගිකයින් අතර බෙදා හරින වියදම්

**ශ්‍රී ලංකා බලශක්ති තුලනය**
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත්කෙරෙන බලශක්ති දත්ත හා සංඛ්‍යා ලේඛන සංග්‍රහය

**උපාය මාර්ගික ඉන්ධන සංචිත**
යම්කිසි පිරියතකට, ස්ථානයකට හෝ ප්‍රදේශයකට ලබාදෙන බලශක්ති සැපයුම් ගැටළු සහගත අවස්ථාවක දී ප්‍රයෝජනයට ගැනීම සඳහා ගබඩාකර තබා ගැනෙන ඉන්ධන ප්‍රමාණයන්

**උපක්ෂේත්‍ර**
යම්කිසි ක්ෂේත්‍රයක් තුළ පවතින යම් ලාක්ෂණික භාවිතයෙන් වෙන්කර හඳුනාගත හැකි කොටස්

**සැපයුම් දාමය**
යම්කිසි භාණ්ඩයක් හෝ සේවාවක් එහි ආරම්භක ස්ථානයේ සිට අවසන් පාරිභෝගිකයා දක්වා ලබාදීම සම්බන්ධ ව්‍යුහයන්, පද්ධති, ක්‍රියාවලි තොරතුරු සහ ඒ සඳහා යොදාගැනෙන සම්පත්

**තිරසර සංවර්ධන ඉලක්ක**
දුප්පත්කම තුරන් කිරීම, පෘථිවිය ආරක්ෂා කර ගැනීම සහ සියලු ජනයා වෙත සාමය හා සමෘද්ධිය අත්පත් කරදීම අරමුණු කොට ඇති ඉලක්ක දාහතක් සපුරා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ මහ සමුළුව මගින් 2015 වසරේදී සිදුකළ කැඳවීම

**සම්ප්‍රේෂණ පද්ධති**
විදුලි ජනක පද්ධති විදුලිය බොදහැරීමේ ජාලය වෙත සම්බන්ධ කිරීම සඳහා ස්ථාපිත කිලෝවෝල්ට් 33ට වඩා වැඩි වෝල්ටීයතාවයකින් යුත් විදුලි පද්ධති

**සර්වජන බලශක්ති සම්පාදනය**
නූතන බලශක්ති මූලාශ්‍ර ලබාගැනීම සඳහා සැමට අවස්ථාව සලසාදීම. විදුලි සේවාව බලාපොරොත්තුවන පාරිභෝගිකයන්ගේ පරිශ්‍රවල සිට මීටර් 100 ක් දක්වා වන ලෙස විදුලි බෙදාහැරීමේ මාර්ග ඇති කිරීම මෙහි සාමාන්‍ය අදහස වේ

**ඉහළ මධ්‍යම ආදායම් මට්ටම**
ඒක පුද්ගල දළ ජාතික ආදායම ඇමෙරිකානු ඩොලර් 3,896 සිට 13,055 අතර ඇති රටවල් ඉහළ මධ්‍යම ආදායම් ඇති රටවල් ලෙස ලෝක බැංකුව විසින් හඳුන්වයි

**ප්‍රභව අන්තය/නිස්සාරණ අංශය**
ඛනිජතෙල් සැපයුම් දාමයේ ඛනිජතෙල් ගවේෂණය, කැණීම් සහ පිරිපහදු පද්ධති වෙත ස්වාභාවික සම්පත් යොමු කිරීමේ ක්‍රියාවලි අඩංගු කොටස

**විචල්‍යතාව**
ස්වාභාවික සංසිද්ධියක් හේතුවෙන් යම් බලශක්ති සම්පතක් ලැබෙන ප්‍රමාණය කාලය සමග වෙනස් වීම. බොහෝ විට මෙය පැය කිහිපයක් හෝ ඊට වැඩි කාල සීමාවක් තුළ සිදුවන වෙනස්කම් පිළිබඳ කරුණකි

**අපතේ යන තාපය**
දහන ක්‍රියාවලියක් තුළ නිතැතින්ම හෝ වුවමනාවෙන් සිදුකෙරෙන තාප හානිය

08 - 865

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.